# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT
# 2021

SRI LANKA
IMMIGRATION AND EMIGRATION




**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**
குடிவரவு குடியகல்வுத் திணைக்களம்
**Department of Immigration & Emigration**

# කාර්යසාධන වාර්තාව
# 2021

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

"සුහුරුපාය"
ශ්‍රී සුභූතිපුර පාර
බත්තරමුල්ල
ශ්‍රී ලංකාව

ප්‍රකාශනය: ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

.

CM 036388 - 25 (2022/06) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

## ආගමන හා විගමන පාලක ජනරාල්වරයාගේ පණිවුඩය



ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට ධනාත්මක දායකත්වයක් සමගින් විදේශ සංචිත වැඩිකරලීමට සමත් හිතකර වීසා ක්‍රමවේදයක් හඳුන්වාදීම සඳහා ආගාමික හා විගාමික පනත හා එහි රෙගුලාසි සංශෝධනය කිරීමට හැකි වූ විශේෂිත වසරක් වන 2021 වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන කාර්යසාධන වාර්තාවට පාලක ජනරාල්වරයා ලෙස පණිවිඩයක් එක් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ රාජ්‍ය අංශය පමණක් නොව පෞද්ගලික අංශය ද අකර්මන්‍යව පැවති 2021 වසරේදී, සේවාලාභීන් වෙනුවෙන් අඛණ්ඩ සේවාවක් සැපයීමට හැකි වීමත්, ඒ හේතුවෙන් අපේක්ෂිත ඉලක්කයන් අභිබවා යමින් ජාතික ආදායමට රුපියල් බිලියන 8.66 ක දායකත්වයක් ලබා දීමට හැකිවීමත් සතුටින් සිහිපත් කරමි.

ආගාමික හා විගාමික පනතෙහි සිදු කල සංශෝධනයන් අනුව විදේශ ආයෝජන අවස්ථා සඳහා සහ විදේශීය සිසුන්ට මෙරට අධ්‍යයන අවස්ථා සඳහා හිතකර වීසා ක්‍රමවේදයක් ඇති කිරීම හා ද්විත්ව පුරවැසිභාවය අහිමි පූර්ව ශ්‍රී ලාංකිකයන්ගේ දැනුම හා ආර්ථික ශක්තීන් රට තුලට ලබා ගැනීමට හැකිවනසේ ස්ථිර වාස වීසා ක්‍රමවේදයක් ඇති කිරීම වැනි ක්‍රමෝපායන් මගින්ද රටේ ආර්ථික වර්ධනය ශක්තිමත් කිරීමට දායකත්වයක් සැලසීමට හැකි වීම පසුගිය වසරේ ලබාගත් ජයග්‍රහණයක් ලෙස සලකමි. එසේම සේවාලාභීන්ගේ සේවා සැපයීම පහසු කිරීම සඳහා ගමන්බලපත්‍ර අළුත් කිරීමේදී මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉල්ලුම් කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට හැකිවීමද, ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි අවදානම් සහගත පුද්ගලයන් මෙරටට ඇතුල්වීමට පෙර හඳුනා ගැනීමට හැකි ක්‍රමවේදයක් සංවර්ධනය කිරීමට කටයුතු කිරීමද විශේෂිත කොට සලකමි.

නව ආගාමික හා විගාමික පනත ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු අවසන් කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව විද්‍යුත් ගමන් බලපත්‍රයක් හඳුන්වා දීම, විදේශීය සංචිත ඉහලට ගෙන යා හැකි ආකාරයේ නව වීසා ක්‍රමවේදයක් හඳුන්වා දීම වැනි ඉදිරි ඉලක්කයන් සහිතව 2022 වසරට ප්‍රවිෂ්ය වී ඇති අපගේ දැක්ම, මෙහෙවර හා කාර්ය භාරයන් සපුරා ගැන්මට මග පෙන්වූ දෙපාර්තමේන්තුව භාර කැබිනට් අමාත්‍ය අතිගරු ජනාධිපතිතුමා, ගරු රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා මෙන්ම අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන ඇතුළු සියළුම රජයේ ආයතන වලට ද, සංක්‍රමණිකයන් සඳහා වූ ජාත්‍යන්තර සංවිධාන ඇතුළු සියළුම ජාත්‍යන්තර සංවිධාන වලටද, පෞද්ගලික නියෝජිතායතන වලටද, සේවා සහ පහසුකම් සපයන ආයතන වලටද, සියළුම සේවාලාභීන්ටද ස්තුතිය පුදකරනු ලබන අතර විශේෂයෙන් කොරෝනා වසංගත තත්ත්වය හමුවේ මෙන්ම වසර අවසානයේ ධාරිතාව ඉක්මවමින් ලැබුන ගමන් බලපත්‍ර ඉල්ලීම් හමුවේ ඉමහත් කැපවීමකින් අඛණ්ඩ සේවාවක් මහජනතාව වෙත ලබා දීමට ඇප කැප වූ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සේවය ඇගයීමට ද මෙය අවස්ථාවක් කොට ගනිමි.

**යූ.වී. සරත් රූපසිරි**
පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
සුහුරුපාය
බත්තරමුල්ල

# පටුන


පිටු අංකය

**01 පරිච්ඡේදය-ආයතනික පැතිකඩ ..................... 1**

1.1 හැඳින්වීම ..................... 1

1.2 දැක්ම, මෙහෙවර, ආයතනයේ අරමුණු ..................... 2

1.3 ප්‍රධාන කාර්යයන් ..................... 2

1.4 සංවිධාන ව්‍යුහය ..................... 3

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ශාඛාවන් ..................... 4

1.5.1 පාලන අංශය ..................... 5

1.5.1.1 පාලන ශාඛාව ..................... 5

1.5.1.2 පුහුණු හා සංවර්ධන ශාඛාව ..................... 5

1.5.1.3 ප්‍රසම්පාදන ශාඛාව ..................... 5

1.5.1.4 ඵලදායිතා ප්‍රවර්ධන ඒකකය ..................... 6

1.5.1.5 ප්‍රවාහන ශාඛාව ..................... 6

1.5.1.6 සුබසාධන ඒකකය ..................... 6

1.5.1.7 මහජන තොරතුරු ඒකකය ..................... 6

1.5.1.8 පිළිගැනීමේ කවුළුව ..................... 6

1.5.1.9 පියසා පරිශ්‍රය ..................... 7

1.5.2 ගමන් බලපත්‍ර අංශය ..................... 7

1.5.2.1 ගමන් බලපත්‍ර ශාඛාව ..................... 7

1.5.2.2 ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව ..................... 8

1.5.2.3 ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව ..................... 9

1.5.2.4 විදේශ දූත මණ්ඩල ශාඛාව ..................... 9

1.5.2.5 තැපැල් ශාඛාව ..................... 9

1.5.2.6 ප්‍රාදේශීය කාර්යාල ..................... 9

1.5.3 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය ..................... 9

1.5.3.1 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව ..................... 10

1.5.3.2 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව ..................... 10

1.5.3.3 නීති ශාඛාව ..................... 11

1.5.4 වීසා හා ප්‍රත්‍යන්ත පාලන අංශය ..................... 13

1.5.4.1 වීසා ශාඛාව ..................... 13

1.5.4.2 තොටුපල ශාඛාව ..................... 15

1.5.4.3 විමර්ශන ශාඛාව ..................... 17

පිටු අංකය

1.5.5 තොරතුරු තාක්ෂණ අංශය ........ 20

1.5.6 පුරාවැසි අංශය ........ 22

1.5.7 ගිණුම් අංශය ........ 22

1.5.8 අභ්‍යන්තර විගණන අංශය ........ 23

**02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ........ 25**

2.1 2021 වර්ෂයේදී අත්කරගත් ප්‍රගතිය ........ 25

2.2 මෙහෙයුම් කාර්යයන් මගින් ආදායම් උපයා ගැනීමේ ප්‍රගතිය ........ 54

2.3 විශේෂ ජයග්‍රහණ ........ 55

2.4 අභියෝග ........ 56

2.5 ඉදිරි ඉලක්ක ........ 56

**03 පරිච්ඡේදය- 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය ...... 58**

**04 පරිච්ඡේදය - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක ........ 77**

**05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ........ 79**

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ ........ 82**

**07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව ........ 91**

- **ඇමුණුම්**

  **ඇමුණුම 01 - විගණකාධිපතිවරයාගේ වාර්තාව**

# 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත හා එහි සංශෝධනයන්ගේද, 1956 ආගාමික හා විගාමික පනතට අදාළව සැකසූ රෙගුලාසි හා එහි සංශෝධනයන්ගේද, පුරවැසිභාවය ප්‍රදානය කිරීමට අදාළ පනත්වල විධිවිධානයන් යටතේද ලද නෛතික අධිකාරිය මත ක්‍රියාත්මක වේ.

ජාතික ආරක්ෂාව තහවුරු වනසේ ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන තැනැත්තන් මෙරටට ඇතුළුවීම හා පිටවීම විධිමත්ව පාලනය කිරීම, මෙරට රැඳී සිටින ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන තැනැත්තන්ගේ කටයුතු අධීක්ෂණය, ශ්‍රී ලාංකීය අනන්‍යතාවය විදේශයන්හිදී තහවුරු කිරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතාවය මත විදේශ ගමන් බලපත් නිකුත් කිරීම, විදේශිකයන්ට වීසා නිකුත් කිරීම හා විදේශයන්හි උපත ලබන ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ දරුවන් සඳහා සහ මෙරට පුරවැසිභාවය ඉල්ලුම් කරන තැනැත්තන් සඳහා පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරය වේ.එමෙන්ම නවීන තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතයෙන් සේවාලාභීන්ට වඩා කාර්යක්ෂම හා සුහදශීලී සේවයක් සපයා දීමට කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් කැපවී ක්‍රියා කරයි.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රජය වෙනුවෙන් රටට ආදායම් උත්පාදනය කිරීමේ මහඟු කාර්යභාරයක නිරත වී සිටින දෙපාර්තමේන්තුවකි. ගෝලීය වසංගතයක් වූ කොවිඩ් 19 ව්‍යාප්තිය හේතුවෙන් 2021 වර්ෂයේ දී ආයතනයේ සමස්ත කාර්යසාධනයට බාධා පැමිණියද, ජනතාවට පීඩනයක් නොවන පරිදි මහජන අවශ්‍යතා වෙනුවෙන් අඛණ්ඩව සේවා සැපයීමක් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. ගුවන් තොටුපල හා වරාය ආගමන විගමන රාජකාරි මෙන්ම ගමන් බලපත්‍ර අවශ්‍යතා වෙනුවෙන් ද, ඇඳිරි නීති සමය තුළ දී ද අවශ්‍ය රාජකාරි ඉටුකර දෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 2021 වර්ෂය තුළදී රුපියල් බිලියන 8.66 ක ආදායමක් ජාතික ආදායමට රැස් කර දීමට හැකියාව ලැබී තිබිණි.

**නෛතික අධිකාරිය**

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 1948 අංක 18 දරන පුරවැසි පනත සහ ඊට අදාළ සංශෝධන
- 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත සහ ඊට අදාළ සංශෝධන
- 1949 අංක 03 දරන ඉන්දියානු හා පාකිස්ථානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත
- 1956 ආගාමික හා විගාමික නියෝග සහ ඊට අදාළ සංශෝධන
- 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත හා ඊට අදාළ සංශෝධන
- 1988 අංක 39 දරන ආදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- 2008 අංක 38 දරන චීන සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- ඉහත පනත්වලට අදාළ සියලුම රෙගුලාසි හා නියෝග
- ආගමන හා විගමන පාලක ජනරාල් විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස්

## 1.2 දැක්ම, මෙහෙවර, ආයතනයේ අරමුණු

**දැක්ම**

කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව බවට පත්වීම

**මෙහෙවර**

ජාතික ආරක්ෂාව හා සමාජ හර පද්ධතිය සුරක්ෂිත කිරීම සහ ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්තා සලසමින්, රටින් බැහැරවන්නන් හා රටට ඇතුළුවන්නන් නියාමනය කිරීම හා පුරවැසි සේවා සැපයීම

**අරමුණු**

- ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රධාන පාර්ශ්වකරුවෙක් ලෙස කටයුතු කිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නම් කරන ලද තොටුපල හරහා නිත්‍යානුකූලව ඇතුළුවීම හා පිටවීම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම.
- ශ්‍රී ලාංකික අනන්‍යතාවය විදේශයන්හිදී තහවුරු කිරීම.
- සේවාලාභීන් සඳහා ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් සැපයීම තුළින් රාජ්‍ය සේවයේ විශිෂ්ඨතම රාජ්‍ය ආයතනය බවට පත්වීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කිරීම හා පිටවීම විධිමත් කිරීම, මෙරට රැදී සිටින ශ්‍රී ලාංකික පුරවැසියන් නොවන තැනැත්තන්ගේ කටයුතු අධීක්ෂණය සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන නොමනා තැනැත්තන් රටින් ඉවත් කිරීම
- ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා විදේශ ගමන් බලපත් නිකුත් කිරීම
- විදේශිකයින් සඳහා වීසා බලපත් නිකුත් කිරීම හා දෙන ලද වීසා කාල සීමාව දීර්ඝ කිරීම.
- ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට අනුශාංගික කාර්යයන්.
- ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට අනුශාංගික කාර්යයන්.

## 1.4 සංවිධාන ව්‍යුහය



## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ශාඛාවන්

### 01. පාලන අංශය

* පාලන ශාඛාව
* පුහුණු හා සංවර්ධන ශාඛාව
* ප්‍රසම්පාදන ශාඛාව
* ඵලදායිතා ප්‍රවර්ධන ඒකකය
* ප්‍රවාහන ශාඛාව
* සුබසාධන ඒකකය
* මහජන තොරතුරු ඒකකය
* පිළිගැනීමේ කවුළුව
* පියස පරිශ්‍රය

### 02. ගමන් බලපත් අංශය

* ගමන් බලපත්‍ර ශාඛාව
* ගමන් බලපත්‍ර සැකසීමේ ශාඛාව
* ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව
* විදේශ දූත මණ්ඩල ශාඛාව
* තැපැල් ශාඛාව
* ප්‍රාදේශීය කාර්යාල

### 03. ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

* ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව
* ඉන්දු ලංකා පුරවැසි ශාඛාව
* නීති ශාඛාව

### 04. වීසා හා ප්‍රත්‍යන්ත පාලන අංශය

* වීසා ශාඛාව
* තොටුපල ශාඛාව
* විමර්ශන ශාඛාව

### 05. තොරතුරු තාක්ෂණ අංශය

### 06. පුරවැසි අංශය

### 07. ගිණුම් අංශය

### 08. අභ්‍යන්තර විගණන අංශය

### 1.5.1 පාලන අංශය

දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලනය, මානව සම්පත් සහ භෞතික සම්පත් කළමනාකරණය, කාර්යාල කළමනාකරණය, වාහන භාවිතය කළමනාකරණය, නඩත්තු කටයුතු, පුහුණු හා සංවර්ධන කටයුතු සහ ප්‍රසම්පාදන කටයුතු, දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය කාර්යාල හා අනෙකුත් කාර්යයන් සඳහා වූ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු මෙම අංශයේ කාර්යයන් වේ. එසේම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර සහ බාහිර අංශ අතර මනා සම්බන්ධීකරණය හා කළමනාකරණය සිදු කිරීම ද පාලන අංශය මඟින් සිදු කරනු ලැබේ. එම කාර්යයන් පහත සඳහන් ශාඛාවන් සහ ඒකකයන් යටතේ ක්‍රියාත්මක වේ. මෙම සියලු කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ පාලක (පාලන) විසිනි.

1. පාලන ශාඛාව
2. පුහුණු හා සංවර්ධන ශාඛාව
3. ප්‍රසම්පාදන ශාඛාව
4. ඵලදායිතා ප්‍රවර්ධන ඒකකය
5. ප්‍රවාහන ශාඛාව
6. සුබ සාධන ඒකකය
7. මහජන තොරතුරු ඒකකය
8. පිළිගැනීමේ කවුළුව
9. පියස පරිශ්‍රය

#### 1.5.1.1 පාලන ශාඛාව

මෙම ශාඛාව මඟින් දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලන කටයුතු සිදු කරනු ලැබේ. එමෙන්ම මානව සම්පත් සහ භෞතික සම්පත් කළමනාකරණය, කාර්යාල කළමනාකරණය, මෙම ශාඛාව යටතේ ක්‍රියාත්මක වේ.

#### 1.5.1.2 පුහුණු හා සංවර්ධන ශාඛාව

මානව සම්පත් සංවර්ධනය ආයතනික ඉදිරිගාමී ප්‍රවේශයක් සඳහා අත්‍යවශ්‍ය නියමයක් වන අතර දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු අවශ්‍යතාවයන් හඳුනා ගැනීම, සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම හා පසු පෝෂණය හා ප්‍රතිඵල ඇගයීම පුහුණු හා සංවර්ධන අංශයේ මුඛ්‍ය කාර්යභාරය වේ. මේ හරහා දිගු කාලීන ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉහළ කළමනාකාරීත්වයේ මඟ පෙන්වීම හා අදහස් යෝජනා ක්‍රියාත්මක කෙරේ.

විධායක, මාණ්ඩලික, ද්විතික හා ප්‍රාථමික කාර්යය මට්ටම්වල නිලධාරීන් වෙනුවෙන් 2021 වසර තුළ දේශීය පුහුණු වැඩසටහන් 24ක් පවත්වන්නට යෙදුනු අතර, ගෝලීයව පවතින වසංගත තත්ත්වය මත විදේශීය පුහුණුවීම් සඳහා නිලධාරීන් යොමු කිරීමක් සිදු නොවුණි.

පවත්වන ලද පුහුණු හා සංවර්ධන කාර්යයන් පිළිබඳව තොරතුරු පිටු අංක 95-99 මඟින් දක්වා ඇත.

#### 1.5.1.3 ප්‍රසම්පාදන ශාඛාව

මෙම ශාඛාව මඟින් දෙපාර්තමේන්තුවට අදාළ සියලුම ප්‍රසම්පාදන කටයුතු ඉටුකරනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුවට වාර්ෂිකව අවශ්‍ය කරන භාණ්ඩ හා සේවාවන් නිවැරදිව හා විනිවිදභාවයෙන් යුතුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා ඊට අදාළ නීති රීති අනුගමනය කරමින් ප්‍රසම්පාදනය කිරීම මෙම ශාඛාවේ අරමුණ වේ.

### 1.5.1.4 ඵලදායිතා ප්‍රවර්ධන ඒකකය

2017 වසරේදී ස්ථාපිත කරන ලද මෙම ඒකකය මෙම දෙපාර්තමේන්තුවේ සේවාවන්, තවදුරටත් කාර්යක්ෂමව හා සඵලදායීව පවත්වා ගැනීම සඳහා වසර පුරා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය.

එහි ප්‍රතිඵලයක් ලෙස 2019 -2021 වර්ෂ සඳහා වූ ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලියට අදාළව එම වසරේ අන්තර් දෙපාර්තමේන්තු අංශයෙන් සමස්ථ දිවයිනෙන්ම දෙවන ස්ථානය හිමි කර ගැනීමට හැකි විය.




### 1.5.1.5 ප්‍රවාහන ශාඛාව

මෙම ශාඛාව මඟින් ප්‍රධාන කාර්යාලයේ හා දිවයින පුරා පිහිටා ඇති වරාය, ගුවන්තොටුපලවල් වෙත සහ ප්‍රාදේශීය කාර්යාල වෙත නිලධාරීන් රාජකාරිය සඳහා යෙදවීමේ දී අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා දෙනු ලැබේ. රාජකාරීමය වශයෙන් අවශ්‍යවන වෙනත් විශේෂ ප්‍රවාහන අවශ්‍යතා සපුරාදීම සිදු කරන අතර දෙපාර්තමේන්තුව සතු වාහන මුළු සංඛ්‍යාව 34 කි.

### 1.5.1.6 සුභසාධන ඒකකය

කාර්ය මණ්ඩල සුභ සාධනය පරමාදර්ශී ඒකකයක් බවට පත් වීම අරමුණු කර ගනිමින් සාමාජිකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයගේ මෙන්ම පොදුවේ මුළු මහත් සමාජයේ සුබසිද්ධිය උදෙසා ආගමික, සාමාජීය හා සංස්කෘතිකමය වශයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ තුලින් කායික හා මානසික වශයෙන් නිරෝගීමත් සේවක පිරිසක් බිහිකරමින්, ඔවුන්ගේ කාර්යක්ෂම හා තෘප්තිමත් සේවාව තුලින් මහජනතාවට වඩාත් ගුණාත්මක සේවයක් ලබාදීම මෙම ඒකකයේ අරමුණයි.

### 1.5.1.7 මහජන තොරතුරු ඒකකය

1962 දුරකතන අංකය යටතේ මහජන තොරතුරු ඒකකය දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පස්වන මහලේ ස්ථාපනය කර ඇත. දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගැනීමට අවශ්‍ය සේවාවන් පිළිබඳ සියළු තොරතුරු මෙමඟින් ලබා ගත හැක.

### 1.5.1.8 පිළිගැනීමේ කවුළුව

දෙපාර්තමේන්තුව වෙතින් සේවා අපේක්ෂිත මහජනයා පැමිණි විගස සුහදශිලී අයුරින් පිළිගැනීම සහ නිවැරදි අංශ වෙත යොමු කිරීම සිදුකරනු ලබයි.

### 1.5.1.9 පියස පරිශ්‍රය

සේවා අපේක්ෂිත මහජනතාව දෙපාර්තමේන්තුව වෙත පැමිණි විගස අවශ්‍ය උපදෙස් ලබා දීම, අයදුම්පත භාර දීම සහ එක් දින සේවාව යටතේ ගමන් බලපත්‍රය නිකුත් කරන තෙක් රැඳී සිටීම සඳහා පියස පරිශ්‍රය ස්ථාපිත කර ඇත. මෙයට අමතරව මෙහිදී ගමන් බලපත්‍ර වීසා සඳහා අවශ්‍ය ඡායාරූප ලබාගැනීමට අවස්ථාව ද අයදුම්පත් පිරවීමට අවශ්‍ය සහයක සේවා ද සලසා ඇති අතර ආපනශාලා, සන්නිවේදන පහසුකම් සපයා ගැනීමට හැකියාව ඇත.

## 1.5.2 ගමන් බලපත්‍ර අංශය

පාලක (ගමන් බලපත්) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය, මහජනතාව සමඟ වඩාත් සමීපතම අංශය වේ. ශ්‍රී ලාංකිකයන්ට විදේශ රටවලට බාධාවකින් තොරව ගමන් කිරීමට, නැවතී සිටීමට හා ආපසු ඒමට භාවිත කළ හැකි වන පරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම සිදු කරනු ලබයි. ගමන් බලපත්‍ර නිකුත් කිරීම එක්දින සේවාව හා සාමාන්‍ය සේවාව යටතේ සිදු කරනු ලබන අතර එක්දින සේවාව දැනට ක්‍රියාත්මක වන්නේ ප්‍රධාන කාර්යාලයේ පමණි.

**අරමුණු හා කාර්යභාරය**

01. නිවැරදි ගුණාත්මක හා සත්‍ය තොරතුරු ඇතුළත් විදේශ ගමන් බලපත්‍ර ශ්‍රී ලාංකික පුරවැසියන් වෙත නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයන් අනුගමනය කිරීම.
02. ශ්‍රී ලාංකීය ගමන් බලපත්‍රයේ ප්‍රමිතිය ආරක්ෂා කිරීමට හා වැඩිදියුණු කිරීමට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.
03. ශ්‍රී ලාංකිකයන්ගේ ආගමන හා විගමන කටයුතු සම්බන්ධයෙන් අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම.
04. ශ්‍රී ලාංකිකයන්ගේ ආගමන හා විගමන කටයුතුවලට අදාළව රාජ්‍ය ආරක්ෂක අංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කිරීම.
05. මෙම අංශයේ කාර්යභාරය පහත සඳහන් ශාඛාවන් 5 ක් හා ප්‍රාදේශීය කාර්යාල 4 ක් ඔස්සේ ක්‍රියාත්මක වේ.
    - ගමන් බලපත්‍ර ශාඛාව
    - ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව
    - ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව
    - විදේශ දූත මණ්ඩල ශාඛාව
    - තැපැල් ශාඛාව
    - ප්‍රාදේශීය කාර්යාල - මහනුවර, මාතර, කුරුණෑගල, වවුනියාව

### 1.5.2.1 ගමන් බලපත්‍ර ශාඛාව

දෛනිකව වැඩිම සේවාලාභීන් සංඛ්‍යාවක් පැමිණෙන ශාඛාව ගමන් බලපත්‍ර ශාඛාවයි. නමුත් COVID 19 වසංගත තත්ත්වය හමුවේ 2021 වර්ෂයේ මුල් කාර්තු දෙක තුල සේවාලාභීන්ගේ පැමිණීමේ විශාල අඩු වීමක් දක්නට ලැබුණි. නමුත් 2021 වර්ෂයේ ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී වාර්තාගත ලෙස සේවාලාභීන්ගේ වැඩි වීමක් දක්නට ලැබුණි. මහජනතාව වෙත වඩාත් සමීප, කාර්යක්ෂම හා කඩිනම් සේවාවක් සැපයීමේ අරමුණින් සාමාන්‍ය සේවාව යටතේ ප්‍රාදේශීය වශයෙන් ගමන් බලපත් ලබා ගැනීම සඳහා මහනුවර, මාතර, වව්නියාව සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය කාර්යාල 4 ක් පිහිටුවා ඇත. මෙම ප්‍රාදේශීය කාර්යාල නියෝජ්‍ය /සහකාර පාලකවරුන් 4 දෙනෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

### 2021 වර්ෂයේ ඉටු කරන ලද විශේෂ කාර්යයන්

- දෙපාර්තමේන්තුවේ සේවාවන් පුළුල් කිරීමේ අරමුණින් නව ප්‍රාදේශීය කාර්යාල 4ක් ස්ථාපිත කිරීමට යෝජනා වූ අතර රත්නපුර හා අම්පාර කාර්යාල ආරම්භ කිරීමේ මූලික සාකච්ඡා පවත්වනු ලැබීය.
- අයදුම්කරුවන්ට වඩාත් ගුණාත්මකභාවයෙන් යුතුව ඔවුන්ගේ ජෛවමිතික තොරතුරු ඇතුළත් ජාත්‍යන්තරව වැඩි පිළිගැනීමක් ඇති විද්‍යුත් ගමන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු 2021 වර්ෂයේදී සම්පාදනය කරනු ලැබීය.
- දැනටමත් ගමන් බලපත් හිමි අයදුම්කරුවන්ට නව ගමන් බලපත්‍රයක් ලබාගැනීමේදී මාර්ගගත ක්‍රමය ඔස්සේ සිය ගමන් බලපත් ලබා ගැනීමට අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු මෙම වර්ෂය තුළ ආරම්භ කිරීමට හැකි විය.








### 1.5.2.2 ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව

ගමන් බලපත්‍ර ශාඛාවෙන් සහ විදේශ දූත මණ්ඩල ශාඛාවෙන් නව ගමන් බලපත්‍ර සකස් කිරීම සඳහා සැකසුම් ශාඛාව වෙත යොමු වන අයදුම්පත්‍ර අදාළ පරීක්ෂා කිරීම්වලින් අනතුරුව පහත සඳහන් පරිදි කටයුතු කරනු ලබයි. දත්ත ඇතුළත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate), ඡායාරූප හා අත්සන් පරිලෝකනය කිරීම (Capture), මුද්‍රණය කිරීම (Print), මුද්‍රණය කරන ලද ගමන් බලපත්‍රවල වෙනස් කිරීම් සහ නිරීක්ෂණ ඇතොත් ඒවා ගමන් බලපත්‍රයේ 4 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print), තත්ත්ව පාලනය කිරීම (Quality Assurance), ගමන් බලපත්‍ර ලැමිනේටින් කිරීම, සැසඳීම හා 4 වන පිටුව පරිලෝකනය කිරීම (Compare & 4th Page Scan) සහ අවසාන තත්ත්ව පරීක්ෂාව (Quality Confirm) සිදු කර ඉන් අනතුරුව එක්දින සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත් නිකුත් කිරීමේ කවුළු වෙතත්, සාමාන්‍ය සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත් තැපැල් ශාඛාව වෙතටත්, විදේශ දූත මණ්ඩල හරහා ලැබෙන අයදුම්පත් වෙනුවෙන් නිකුත් කරන ගමන් බලපත් විදේශ දූත මණ්ඩල ශාඛාව වෙතටත් යවනු ලබයි.

මීට අමතරව සංශෝධන කටයුතු සඳහා යොමු කෙරෙන අයදුම්පත්‍ර අදාළ පරීක්ෂා කිරීම්වලින් අනතුරුව දත්ත ඇතුළත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate) හා සංශෝධන 4 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print) ද සිදු කරනු ලබයි.

### 1.5.2.3 ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව

නිකුත් කරන ලද ගමන් බලපත්‍රවලට අදාළව ගමන් බලපත්‍රධාරීන් පසුව කරන ඉල්ලීම් සලකා බලා විවිධ කාණ්ඩ යටතේ සංශෝධනයන් ගමන් බලපත්‍රයට ඇතුළත් කිරීම මෙම ශාඛාව මගින් සිදුකරනු ලබයි.

### 1.5.2.4 විදේශ දූත මණ්ඩල ශාඛාව

විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ගමන් බලපත්‍ර නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. විදේශ දූත මණ්ඩල මඟින් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කෙරෙන අයදුම්පත් සඳහා සකස් කළ නව ගමන් බලපත් නැවත විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විදේශ දූත මණ්ඩල වෙත යොමු කරන අතර විදේශ දූත මණ්ඩල මඟින් අදාළ අයදුම්කරුවන් වෙත නිකුත් කිරීම සිදු කරයි.

**විශේෂිත කාර්යයන්**

- COVID 19 වසංගත තත්ත්වය හමුවේ ගුවන් මගින් අයදුම්පත් ලැබීමේ දී ඇතිවන ප්‍රමාදය වළක්වාලීම සඳහා විද්‍යුත් තැපැල මගින් ගෙන්වා ගනු ලැබූ අයදුම්පත් සඳහා ගමන් බලපත්‍ර සකස් කිරීම සිදු කරන ලදී.
- මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ලබා ගැනීමට පරිගණක දත්ත පද්ධතියක් සකස් කිරීමේ මූලික කටයුතු සියල්ල අවසන් කරන ලදී.
- ගමන් බලපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළයුතු අදාළ ලේඛනවල අවශ්‍යතාව සමාලෝචනය කර, සෑම දූත මණ්ඩලයකටම ඒකමිතියකින් යුතුව එම ලේඛන ඉදිරිපත් කළහැකි චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

### 1.5.2.5 තැපැල් ශාඛාව

සාමාන්‍ය සේවය යටතේ සකස් කරනු ලබන ගමන් බලපත් ප්‍රමාදයකින් තොරව අයදුම්කරුවන්ට ලියාපදිංචි තැපැල් මගින් යැවීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වේ.

### 1.5.2.6 ප්‍රාදේශීය කාර්යාල

මාතර, මහනුවර, වවුනියාව හා කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල පිහිටා ඇති අතර සාමාන්‍ය සේවය යටතේ ගමන් බලපත් නිකුත් කිරීම හා ගමන් බලපත්වල සංශෝධන කටයුතු එමගින් සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පළාත් මට්ටමින් විමධ්‍යගත කිරීම යටතේ සියළුම පළාත් ආවරණය වන පරිදි නව ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමේ මූලික කටයුතු සිදු කෙරෙමින් පවතී.

## 1.5.3 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

මෙම අංශය යටතේ ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව, ඉන්දු ලංකා පුරවැසි ශාඛාව හා නීති ශාඛාව යන ශාඛාවන් ක්‍රියාත්මක වන අතර අධීක්ෂණය පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ)/ නියෝජ්‍ය කොමසාරිස් (ඉන්දු ලංකා) මගිනි.

### 1.5.3.1 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංවර්ධන හා ප්‍රතිපත්ති සම්පාදන කටයුතු වඩාත් සැලසුම් සහගතව හා වඩා විධිමත් අයුරින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම ශාඛාව ස්ථාපිත කර ඇත.

**ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යන්**

1. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් ඉටුකිරීමේදී අදාළ වන ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම.
2. දෙපාර්තමේන්තුවට අදාළ නීති, අණ පනත් සංශෝධනය.
3. අභ්‍යන්තර චක්‍රලේඛ හා කාර්ය පටිපාටි සකස් කිරීම හා නිකුත් කිරීම, මෙහෙයුම් අත්පොත් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම.
4. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) සකස් කිරීම හා එය ක්‍රියාවට නැගීමට අදාළ කටයුතු කිරීම.
5. පසුගිය වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව සකස් කිරීම.
6. අනෙකුත් ආයතනවලට මාසිකව, කාර්තු වශයෙන් හා වාර්ෂිකව යැවිය යුතු ප්‍රගති වාර්තා සකස් කිරීම හා නියමිත දිනට එම වාර්තා අදාළ ආයතන වෙත යොමු කිරීම.
7. රේඛීය අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන සමඟ ප්‍රතිපත්තිමය කටයුතුවලට අදාල රාජකාරි සම්බන්ධීකරණය කිරීම.
8. දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය අනුව අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම හා වෙනත් අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමට කටයුතු කිරීම.
9. පාර්ලිමේන්තුවේ වාචික පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කිරීම.
10. දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂිත ව්‍යාපෘති සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම හා වාර්ෂිකව සිදු කරන ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය, සම්බන්ධීකරණය මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.

**2021 වර්ෂයේ විශේෂ කාර්යයන්**

- දෙපාර්තමේන්තුව යටතේ පවත්නා ප්‍රාදේශීය කාර්යාල සමීක්ෂණය සඳහා නව ක්‍රමවේදයක් සකස් කිරීම.
- නව ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම.
- වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇලපිටිවල ග්‍රාම නිලධාරි වසමේ මිල්ලගහවත්ත නැමැති ස්ථානයේ විදේශිකයන් තාවකාලිකව රඳවා තබා ගැනීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ප්‍රාග්ධන ව්‍යාපෘතීන් 93%ක ප්‍රගතියකින් අවසන් කිරීමට අවශ්‍ය මෙහෙයුම් කටයුතු සිදුකිරීම.

### 1.5.3.2 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව

පාලක ජනරාල්වරයා නිල බලයෙන් ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ධූරය දරන අතර ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝජ්‍ය කොමසාරිස් වශයෙන් පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ) කටයුතු කරයි.

1949 අංක 03 දරන ඉන්දියානු හා පාකිස්ථානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත,1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත, 1988 අංක 39 දරන ආදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත හා 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවය ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත යන පනත්වල සඳහන් ආකාරයට සුදුසුකම් සපුරන තැනැත්තන්ට එම පනත් ක්‍රියාත්මක වූ දිනයේ සිට බලපවත්වන පරිදි ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය හිමි වී ඇත. ශ්‍රී ලංකාවේ වාසය කරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන් වෙත

පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට අනුෂාංගික කාර්යයන් ඉටු කිරීම හා මෙයට අමතරව චීන සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමට අදාළ 2008 අංක 38 දරන චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත අනුව ඊට අනුශාංගික කාර්යයන් ඉටු කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

### 1.5.3.3 නීති ශාඛාව

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නීති අංශය මගින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්යානුබද්ධ අණපනත් මගින් ලැබී ඇති නෛතික අධිකාරිය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය උපදෙස් හා සහාය ලබාදීමටත්, අවශ්‍යතාවයන් අනුව අදාළ අණපනත් සංශෝධනය කිරීමට කටයුතු කිරීම මඟින් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට සහාය වීම මෙම ශාඛාවේ කාර්යභාරය වේ.

**නීති අංශයෙන් ඉටුකරන ලද කාර්යයන්:**

**අධිකරණය හා සම්බන්ධ කටයුතු.**

i. දෙපාර්තමේන්තුව මගින් පවරා ඇති නඩුවලට අදාළ සිතාසි, වරෙන්තු කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගැනීම සහ එම සිතාසි, වරෙන්තු අවශ්‍ය පුද්ගලයන් වෙත යොමු කිරීමට කටයුතු කිරීම.

ii. පාලක ජනරාල් හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකු වගඋත්තරකරුවෙකු ලෙස සඳහන් කරන නඩුවලට අදාලව නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

iii. පාලක ජනරාල් හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුට අධිකරණය ඉදිරියේ සාක්ෂි දීම පිණිස සිතාසි යොමු කර ඇති අවස්ථාවන්හිදී අදාළ තොරතුරු සහ ලිපිගොනු සකස් කර සුදුසු නිලධාරින් අදාළ දිනයන්හිදී අධිකරණයේ පෙනී සිටීම හා සාක්ෂි ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම. මෙම කාලසීමාවට අදාළව නව නඩු 103 ක් සහ පැවති නඩු 160 ක් සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

iv. අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීමට නොහැකි, තොරතුරු අසම්පූර්ණ අධිකරණ නියෝග සම්බන්ධ දැනුවත් කිරීමේ ලිපි සහ අධිකරණයට යොමු කරන තොරතුරු වාර්තා 1052 ක් සකස් කර අදාළ අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් වෙත යොමු කිරීම.

**ගිවිසුම් හා සම්බන්ධ කටයුතු**

i. රාජතාන්ත්‍රික හා රාජකාරි ගමන් බලපත්‍ර දරන්නන් සඳහා ද්විපාර්ශ්වික වීසා නිදහස් කිරීමේ ගිවිසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සිදුකිරීමට කටයුතු කිරීම.

ii. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට අදාළ වන්නාවූ කාර්යයන්ට සම්බන්ධ දේශීය ආයතන සමඟ දෙපාර්තමේන්තුව එළඹ ඇති ගිවිසුම් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

iii. මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාළව විදේශ කටයුතු අමාත්‍යාංශයෙන්, ආරක්ෂක අමාත්‍යාංශයෙන් හා වෙනත් අමාත්‍යාංශවලින් යොමු කරන ලද ශ්‍රී ලංකාව සමඟ විදේශ රටවල් අත්සන් කිරීමට නියමිත විදේශීය ගිවිසුම් සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දීම හා මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාලව ආරක්ෂක අමාත්‍යාංශයෙන් යොමු කරන ලද ගිවිසුම් සම්බන්ධයෙන් නිරීක්ෂණ යොමු කිරීම.

iv. නැවත ප්‍රවේශ කර ගැනීමේ ගිවිසුම් (re-admission) සකස් කිරීමට අවශ්‍ය සහාය ලබා දීම හා විදේශ අමාත්‍යාංශය සමඟ එක්ව අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

v. දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නාවූ ගොඩනැගිලි, නිවාස සම්බන්ධව අදාළ පාර්ශව අතර ඇති කරගන්නා බදු ගිවිසුම් සැකසීමට අදාළ නීති උපදෙස් ලබා දීම හා ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම. (මහනුවර, කුරුණෑගල, මාතර, වව්නියාව කාර්යාල සහ හම්බන්තොට, ත්‍රිකුණාමලය, යාපනය සේවක විවේකාගාරවලට අදාළ බදු ගිවිසුම්)

vi. සේවා සපයන අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සමඟ ඇතිකර ගනු ලබන ගිවිසුම්වලට අදාළව නිශ්කාශන ලබා දීම.

vii. මෙම දෙපාර්තමේන්තුව වෙනත් රාජ්‍ය ආයතන සමඟ එළඹෙන ගිවිසුම් සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දීම, නීතිපති දෙපාර්තමේන්තු නිර්දේශ ලබා ගැනීම සහ අත්සන් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

**වෙනත් පැමිණිලි**

I. පොලිස් ස්ථානාධිපතිවරුන්, වෙනත් ආයතන සහ පුද්ගලයන් විසින්, ආගාමික හා විගාමික පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම්වලට අදාළව සිදුවන වංචා සහ වෙනත් පැමිණිලිවලට අදාළව මෙම අංශයට යොමු කරන ලද ලිපි 30 ක් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

**තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත හා සම්බන්ධ ගැටළු**

I. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ ඉල්ලීම් 27 ක් සඳහා එම පනතට අනුව තොරතුරු යොමු කිරීම.

II. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ අභියාචනා 04ක් සඳහා එම පනතට අනුව පිළිතුරු යොමු කිරීම.

**විශේෂ රාජකාරි ඉටුකිරීම**

- පනතට ස්ථිර වාස වීසා තත්ත්වය හඳුන්වා දීම සහ පනතේ වීසා ප්‍රදානය කිරීමේ කාල සීමාවන් දීර්ඝ කිරීමට අදාළ සංශෝධනයන් කිරීම සඳහා ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරීම හා සම්බන්ධ කටයුතුවලට අදාළව ආරක්ෂක අමාත්‍යාංශ උපදේශක කාරක සභාවට සහ පනත සම්බන්ධ විවාදය අවස්ථාවේ පාර්ලිමේන්තු රැස්වීම් සඳහා සහභාගී වීම.

- මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ප්‍රත්‍යන්ත අවධානම් ඇගයීමේ මධ්‍යස්ථානය (BRAC) යන ආයතන සමඟ මෙම දෙපාර්තමේන්තුව එළඹි ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

### 1.5.4 වීසා හා ප්‍රත්‍යන්ත පාලන අංශය

පාලක (වීසා හා ප්‍රත්‍යන්ත පාලන) ගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ. වීසා කටයුතු වීසා ශාඛාව මගින්ද, ප්‍රත්‍යන්ත පාලන කටයුතු තොටුපළ හා විමර්ශන ශාඛා මගින්ද ක්‍රියාත්මක වේ.

#### 1.5.4.1 වීසා ශාඛාව

1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනතේ III කොටසෙහි ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කිරීමට අදාළව අඩංගු විධි විධාන අනුව ද පනතට අදාළව සම්පාදනය වූ 1956 ආගමන හා විගමන රෙගුලාසින්හි අංක 02 සිට අංක 35 ප්‍රකාරව ජාතික ආරක්ෂාව තහවුරු වන පරිදි ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා මෙරට තුළ නීත්‍යානුකූලව රැඳී සිටීමට වලංගු වීසා බලපත් නිකුත් කිරීම හා වීසා දිර්ඝ කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ.

වීසා නිකුත් කිරීම හා දීර්ඝ කිරීම තුළින් රටේ ජාතික ආදායමට සැලකිය යුතු දායකත්වයක් ලබා දීම, අත්‍යවශ්‍ය ක්ෂේත්‍රයන් සඳහා විදේශික සේවා නියුක්තියට පහසුකම් සැලසීම මගින් ජාතික සංවර්ධනයට දායකවීම, රටට හිතකර ආකාරයට වීසා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ මූලික අරමුණ වේ.

**නේවාසික /වාස වීසා (Residence Visa)**

විශේෂිත අරමුණු සඳහා ශ්‍රී ලංකාව තුළ දීර්ඝකාලීනව වාසය කිරීමට අපේක්ෂා කරන පහත සඳහන් කාණ්ඩවලට අයත් ශ්‍රී ලාංකිකයින් නොවන පුද්ගලයින්හට මෙම වීසාවන් නිකුත් කෙරේ.

1. සේවා නියුක්තිකයන්
    * ආයෝජන මණ්ඩල යටතේ ව්‍යාපෘතිවල සේවයේ නියුක්ත වූවන්
    * රාජ්‍ය නොවන සංවිධානවල සේවකයන්
    * විදේශ දූත මණ්ඩල යටතේ ඇති ආයතනවල සේවයේ නියුක්ත වූවන්
    * පෞද්ගලික සමාගම් / රාජ්‍ය අංශය මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතිවල සේවකයන්

2. ආයෝජනය කරන්නන්
    * ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රාග්ධනය ආයෝජනය කරන්නන්
    * ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික කටයුතුවල නියුක්ත වූවන්

3. ආගමික කාර්යයන් සඳහා පැමිණෙන්නන්
    * පූජ්‍ය පක්ෂය
    * ආගමික ස්ථාන ඉදි කරන්නන් / ආවතේවකරුවන්

4. ශිෂ්‍යයන්
    * විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්
    * රජයේ අනුමත අධ්‍යාපනික ආයතනවල ශිෂ්‍යයන්

5. 1967 ඉන්දු ලංකා ගිවිසුමෙන් ආවරණය වන ලියාපදිංචි ඉන්දියානුවන්
6. හිටපු ශ්‍රී ලාංකිකයන් සහ ඔවුන්ගේ යැපෙන්නන්
7. ශ්‍රී ලාංකිකයෙකුගේ පවුලේ සාමාජිකයන්
    * ස්වාමි පුරුෂයා හෝ භාර්යාව
    * විදේශ ජාතිකත්වය හිමි ළමයින්
8. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩලවල සේවයේ යෙදී සිටින්නන් හා යැපෙන්නන්
9. මගේ සිහින නිවාස වීසා (My Dream Home)
10. ආගන්තුක වීසා (Residence Guest Scheme)
11. වෛද්‍ය හේතූන් මත රැඳී සිටින්නන්

**පැමිණීමේ වීසා (Visit Visa)**

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මඟින් හා විද්‍යුත් සංචරණ අනුමැතිය යටතේ සංචාරක හෝ ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් කෙටි කාලීනව විදේශිකයන් වෙත මෙම වීසාවන් නිකුත් කරනු ලැබේ.

1. **සංචාරක වීසා** (Tourist Visa)

- ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම, ඥාතීන් බැලීම, ආයුර්වේද ප්‍රතිකර්ම, යෝග හා භාවනා ආදී කටයුතු සඳහා කෙටි කාලීනව පැමිණෙන විදේශිකයන් වෙනුවෙන් විද්‍යුත් සංචරණ අනුමැතිය යටතේ දින 30ක කාලයක් හෝ ඉන් කොටසක් සඳහා මෙම වීසා නිකුත් කෙරේ.

2. **සංචාරක නොවන කටයුතු වෙනුවෙන් වීසා** (Business Visa)

- සංචාරක නොවන කෙටි කාලීන ව්‍යාපාරික ස්වරූපයේ අනෙකුත් කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ට මෙම වීසා නිකුත් කරයි. මේ සඳහා අදාළ කාර්යය තහවුරු කෙරෙන ලේඛන ඉදිරිපත් කළ යුතුය. (මේ යටතේ වැඩමුළු,සම්මන්ත්‍රණ, ප්‍රාසාංගික කටයුතු,ව්‍යාපාරික සාකච්ඡා, ආයතනික වැඩමුළු සඳහා සහභාගි වීම ආදිය)

**මාර්ගස්ථ වීසා (Transit Visa)**

- ශ්‍රී ලංකාවෙන් බැහැරව වෙනත් රටක සිට තවත් රටක ගමනාන්තයක් කරා යන අතරතුරදී කෙටි කාලීනව ශ්‍රී ලංකාවට ඇතුළුවීම සඳහා නිකුත් කරනු ලබන වීසාවකි. මෙය දින 02ක උපරිමයකට යටත්ව නොමිලයේ නිකුත් කරනු ලැබේ.





### 1.5.4.2 තොටුපළ ශාඛාව

ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කරමින්, එකී විදේශ ගමන් බලපත්‍ර දරන්නන් ශ්‍රී ලංකාවෙන් පිටවීම විධිමත් කිරීම, ශ්‍රී ලාංකික ගමන් බලපත්‍රධාරීන් ඇතුළු සමස්ත ආගාමිකයන්ගේ හා විගාමිකයන්ගේ නිෂ්කාශණ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව, ජාතික ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබාදෙමින්, ජාතික ආර්ථිකයට ධනාත්මක උත්තේජනයක් ඇතිවන පරිදි, දිවයින වටා පිහිටි සියලුම අනුමත මුහුදු හා ගුවන් තොටුපළවලදී ප්‍රත්‍යාන්ත පාලනය ඉටුකිරීම මෙම ශාඛාව මඟින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් වේ.

**තොටුපළ ශාඛාව මඟින් ඉටු කරනු ලබන කාර්යයන්**

- ශ්‍රී ලංකාවට පැමිණෙන හා ශ්‍රී ලංකාවෙන් පිටවන මගීන්ගේ නිෂ්කාශණ කටයුතු ඉටුකිරීම.
- විදෙස් රටවල තානාපති කාර්යාල ශ්‍රී ලංකාව තුල ස්ථාපනය කර නොමැති රටවල් සඳහා ඇතුළුවීමට අවශ්‍ය වීසා ලබා ගැනීමට අවශ්‍ය වන පුද්ගලයන්ගේ ගමන් බලපත් අදාළ තානාපති කාර්යාල ඇති රටවල් වෙත තැපැල් මඟින් යැවීම (කුරියර් කිරීම) සඳහා අනුමැතිය ලබාදීම.
- ශ්‍රී ලංකාවේ අනුමත වරායක නැංගුරම් ලා තිබෙන නැවක නාවික කාර්ය මණ්ඩලයට තාවකාලිකව ගොඩබිමට පැමිණීමට අවසර පත්‍ර නිකුත් කිරීම.
- ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශික නාවික කාර්ය මණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම.
- විදේශගත වූ මගීන්ගේ ආගමන විගමන තොරතුරු ඇතුළත් ලිපි විවිධ ආයතනවල අවශ්‍යතාවය අනුව නිකුත් කිරීම.
- ශ්‍රී ලංකාවට විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) නොමැතිව පැමිණෙන සංචාරකයන් හට තොටුපළවල දී විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ලබාදීම.
- උසාවි මඟින් නිකුත් කර ඇති රටින් පිටවීම හා මෙරටට පැමිණීම තහනම් නියෝග ක්‍රියාත්මක කිරීම හා වෙනත් ආයතන මඟින් පුද්ගලයන් රටින් පිටවීම හා රටට පැමිණීම පිළිබඳව විමසා එවන ලිපි සම්බන්ධ රාජකාරි.
- ශ්‍රී ලංකාවෙන් පිටවීමේ දී හා ශ්‍රී ලංකාවට පැමිණීමේ දී තොටුපළවල දී මගින් විසින් සම්පූර්ණ කළයුතු ආගමන / විගමන පත්‍රිකා නිකුත් කිරීම.
- තොටුපළවලට අනුයුක්ත ආගමන හා විගමන නිලධාරීන්ගේ සේවාවන් මෙහෙයවීම, අධීක්ෂණය කිරීම, සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම.

**අනුමත ඇතුළුවීමේ හා පිටවීමේ තොටුපළ**

1. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ - කටුනායක
2. මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ - මත්තල
3. කොළඹ ගුවන් තොටුපළ - රත්මලාන

4. කොග්ගල ගුවන් තොටුපළ
5. යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ
6. කොළඹ වරාය
7. ගාල්ල වරාය
8. රුහුණු මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය
9. ත්‍රිකුණාමල වරාය
10. තලේමන්නාරම් ජැටිය
11. නොරොච්චෝලේ වරාය
12. ඔලුවිල් වරාය
13. දික්ඕවිට වරාය - කොළඹ වරායේ දික්ඕවිට පර්යන්තය

**විදේශික නාවික කාර්ය මණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම**

සියලුම නාවික කාර්ය මණ්ඩලවල සෑම සාමාජිකයෙකුම රටට ඇතුළුවීමට ප්‍රථම බැඳුම්කරයකට අත්සන් කළ යුතු වන අතර, ඒ සඳහා රුපියල් 1150.00 ක බැඳුම්කර ගාස්තුවක් අය කරනු ලබයි. ශ්‍රී ලංකාවට පැමිණෙන නැව්වල සේවයට යන විදේශිකයින් හා නැව්වල සේවය කර ශ්‍රී ලංකාවෙන් බැහැර වන විදේශිකයින් සඳහා මෙම බැඳුම්කර නිකුත් කරන අතර, අදාළ බැඳුම්කර ගාස්තුව රටට ඇතුළුවන්නාගේ මෙරට නියෝජිතයා විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුවේ.

**2021 වර්ෂය තුළ ඉටු කළ විශේෂිත කාර්යයන්**

- අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන සේ නව ආරක්ෂණ ක්‍රමවේදයන් සහිත බලයලත් නිලධාරීන්ගේ පැමිණීමේ හා පිටවීමේ මුද්‍රා සහ එම බහලුම් අලුතින් සකස් කිරීම. මේ සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකිරීම.
- නොරොච්චෝල වරාය ආශ්‍රිතව නිලධාරීන්ට පහසුකම් ලබාදීම.
- දික්ඕවිට ධීවර වරාය ආශ්‍රිතව ආගමන හා විගමන කාර්යාලයක් පිහිටුවීම හා එම කාර්යාලයේ සිට මූලික රාජකාරි ආරම්භ කිරීම.
- රත්මලාන ගුවන් තොටුපොළෙහි ආගමන විගමන කාර්යාල පරිශ්‍රයන් වැඩිදියුණු කිරීම, නිලධාරි විවේකාගාරය ආරම්භ කිරීම හා අනෙකුත් පහසුකම් සැපයීම.
- ගාලු වරාය ආශ්‍රිතව නව කාර්යාල හා විවේකාගාර ගොඩනැගිල්ලක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා අනෙකුත් ආයතන සමඟ අවශ්‍ය මූලික කටයුතු සිදුකිරීම.
- නාවිකයන් සඳහා වන බැඳුම්කර යාවත්කාලීන කිරීම සඳහා ආගමන හා විගමන පාලක ජනරාල්තුමාට නිර්දේශ ලබාදීම.
- නාවිකයන් සඳහා වූ බැඳුම්කර මාර්ගගත ක්‍රමවේදයක් ඔස්සේ සිදු කිරීම පිළිබඳව අවශ්‍ය මූලික කටයුතු සිදුකිරීම.
- යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ආශ්‍රිතව කාර්යාලය සඳහා සහ විවේකාගාරය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ඉඩමක් ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සොයාබැලීම.

### 1.5.4.3 විමර්ශන ශාඛාව

මෙම දෙපාර්තමේන්තුවේ විමර්ශන ශාඛාව මගින් 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත සහ ඒ යටතේ පනවන ලද 1956 රෙගුලාසි සහ ජාත්‍යන්තර නීතිවලට අනුකූල නොවන සහ රටෙහි ආරක්ෂාවට තර්ජනයක් වන විදේශිකයන්, ශ්‍රී ලංකාවට ඇතුළුවීමට පෙර, ඇතුළුවන විට හා එහි රැඳී සිටින විට එම විදේශිකයන් හඳුනා ගැනීම, ශ්‍රී ලංකාව තුළ සිටින විදේශිකයන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, ආගාමික හා විගාමික නීති උල්ලංඝනය කරමින් රැඳී සිටින විදේශිකයන් අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම, රටින් ඉවත් කිරීම හෝ රටින් පිටුවහල් කිරීම සඳහා අවශ්‍ය විමර්ශන කටයුතු මෙහෙයවීම සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදුකරනු ලැබේ.

මෙම ශාඛාව ඒකක 5කින් සමන්විත වේ.

1. විමර්ශන ඒකකය
2. තැනැත්තන් වෙළෙඳාම තුරන් කිරීමේ මධ්‍යස්ථානය (NAHTRC)
3. අවදානම් තක්සේරු මධ්‍යස්ථානය (RISK ASSESSMENT CENTER)
4. රැඳවුම් මධ්‍යස්ථාන (DETENTION CENTERS)
5. දේශසීමා ආවේක්ෂණ ඒකකය (BORDER SURVEILLANCE UNIT)

#### 1.5.4.3.1 විමර්ශන ඒකකය

ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරමින් මෙරට රැඳී සිටින විදේශිකයින් අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම හා රටින් ඉවත් කිරීමේ කටයුතු කිරීම මෙම ඒකකය මගින් සිදු කරයි.

විදේශිකයන් රටින් ඉවත් කිරීමට හේතු.

1. වීසා කාලය ඉක්මවා රැඳී සිටීම.
2. වීසා කොන්දේසි උල්ලංඝනය කිරීම (උදා: සංචාරක වීසාවක් දරමින් රැකියාවක හෝ සමාජ විරෝධී ක්‍රියාවන්හි නිරත වීම).
3. අධිකරණ නියෝග අනුව

**විදේශිකයන්ට රට තුළට ඇතුළුවීමට අවසර ලබා නොදීමට හේතු**

1. නිර්ව්‍යාජ සංචාරකයකු නොවීම.
2. ව්‍යාජ ගමන් බලපත්‍ර භාවිතය.
3. විධිමත් වීසාවක් ලබා නොතිබීම. (වීසා ලබාදිය නොහැකි රටවල් හා වෙනත්)
4. මීට පෙර ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කිරීම මත මෙරටින් ඉවත් කර තිබීම.
5. අසාදු ලේඛනගත කිරීම.
6. විද්‍යුත් සංචරණ අනුමැතිය ලබා නොතිබීම. (No ETA)
7. ප්‍රමාණවත් මුදල් නොතිබීම.
8. ආපසු යාමේ ගුවන් ටිකට් පත නොමැති වීම.
9. ජාත්‍යන්තර පොලීසියේ රතු දත්ත හා නිවේදන.
10. අධිකරණ නියෝග.
11. ආගමන හා විගමන පාලක ජනරාල්ගේ නියෝග.

### 1.5.4.3.2 තැනැත්තන් වෙළෙඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය (NAHTRC)

මෙය ශ්‍රී ලංකාව තුළ හා අන්තර්ජාතිකව, ශ්‍රී ලංකාවට එල්ල විය හැකි මිනිස් වෙළෙඳාම හා මිනිස් ජාවාරම සම්බන්ධයෙන් පැන නගින තර්ජන අවම කිරීමට ස්ථාපිත කර ඇති ඒකකයයි. මෙමගින් තැනැත්තන් වෙළෙඳාම සම්බන්ධයෙන් දේශීය නීතිය වන, 2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහයේ (සංශෝධන) පනතේ 360 (ඇ) වගන්තිය බලාත්මක කිරීම සඳහා සහය වීම හා සංවිධානාත්මක අපරාධ හා සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතීන්ගෙන් ශ්‍රී ලංකාව කෙරෙහි ඇති වගකීම ඉටුකිරීමට සහයවීම සිදු කරයි.

**කාර්යභාරය**

- ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් පුද්ගල වෙළෙඳාමකට හෝ මිනිස් ජාවාරමට සම්බන්ධ වී ඇති දැයි සොයා බලා වින්දිතයන් හඳුනා ගැනීම, විමර්ශනයන්ට යොමු කිරීම, විමර්ශන සඳහා සහභාගි වීම හා විමර්ශන අවසන් වූ පසු මව්රට බලා යැවීමේ කාර්යයන්ට දායක වීම.

- අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති තැනැත්තන් වෙළෙඳාම තුරන් කිරීමේ කාර්ය සාධන බලකායේ, වාර්ෂිකව සකස් කරන ක්‍රියාකාරී සැලැස්ම හා එක්සත් ජනපදය විසින් වාර්ෂිකව සකස් කරන තැනැත්තන් වෙළෙඳාම පිළිබඳ වාර්තාව (TIP report) වෙනුවෙන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නියෝජනය ලබා දීම.

- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් විවිධ අවස්ථාවල තැනැත්තන් වෙළෙඳාම තුරන් කිරීම සඳහා පැවැත්වෙන වැඩමුළුවලට සහභාගී වීම හා ඒවායෙහි සම්පත් දායකයින් ලෙස කටයුතු කිරීම.

- ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධ මැඩ පැවැත්වීම සම්බන්ධයෙන් පුහුණු ඒකකය හා එක්ව බලයලත් නිලධාරින් හා ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරින් පුහුණු කිරීම, ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් වර්ධනය සඳහා දායක වීම හා ඒ සඳහා ජාත්‍යන්තර හා ජාතික ආයතන සමග සම්බන්ධීකරණය කිරීම.

- ඉහත කාර්යයන්ට අමතරව සරණාගතයින් පිළිබඳව තොරතුරු පද්ධතියක් ද මෙම ඒකකය විසින් පවත්වාගෙන යනු ලැබේ. 2005 වර්ෂයේ විදේශ කටයුතු අමාත්‍යාංශය සමග එළඹි ගිවිසුමකට අනුව මෙරට තුළ ක්‍රියාත්මක එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ රාජ්‍ය නොවන ආයතනයක් වන එක්සත් ජාතීන්ගේ සරණාගතයන් සඳහා වන මහ කොමසාරිස් කාර්යාලය (United Nations High Commissioner for Refugees) මගින් සරණාගතයින් (Refugees) සහ සරණාගත තත්ත්වය අයදුම් කර සිටින්නන් (Asylum Seekers) ලෙස විදේශිකයන් ලියාපදිංචිය සිදු කරන අතර සරණාගත තත්වය පිරිනැමූවන් නැවත තුන්වන රටක පදිංචියට යොමු කරවයි. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මෙම ඒකකය මෙමඟින් මෙලෙස රැඳී සිටින විදේශිකයන් සම්බන්ධව යාවත්කාලීන තොරතුරු ගොනුවක් පවත්වාගෙන යනු ලබන අතර ජාතික ආරක්ෂාව හා සම්බන්ධ අනෙකුත් රාජ්‍ය ආයතන වෙත අවශ්‍ය අවස්ථාවන්හිදී එම තොරතුරු ලබාදීම හා එම විදේශිකයන් සම්බන්ධව ආගාමික හා විගාමික පනතට අදාළව අධීක්ෂණ කටයුතු සිදු කිරීම කරනු ලබයි.

**වෙනත් කටයුතු**

- දේශසීමා ආවේක්ෂණ ඒකකය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටියක් හඳුන්වා දීම.
- දේශසීමා ආවේක්ෂණ ඒකකය මගින් හඳුනාගත් අවිධිමත් සංක්‍රමණ පිළිවෙත් පිළිබඳ වාර්තා අදාළ අංශ වෙත දැනුවත් කිරීම.

### 1.5.4.3.3 අවදානම් තක්සේරු මධ්‍යස්ථානය (RISK ASSESSMENT CENTER)

- 2019 මැයි මස විමර්ශන අංශය යටතේ පිහිටුවන ලද මෙම මධ්‍යස්ථානය මගින් ප්‍රත්‍යන්ත පාලන කටයුතුවලට අදාළ හා ඊට ආනුෂංගික බුද්ධිමය තොරතුරු එක්රැස් කිරීම, සකස්කිරීම, සැලසුම් කිරීම හා විශ්ලේෂණය කිරීම තුළින් ශ්‍රී ලංකාවට ඇතුළුවීමට බලාපොරොත්තුවන, රටට ඇතුළුවන, රට තුළ රැඳී සිටින හා ශ්‍රී ලංකාවෙන් පිටවන අවදානම් සහගත මගීන් හා ප්‍රවණතා කලින් හඳුනා ගැනීම සිදු කරයි. එමගින් ඔවුන් රටට පැමිණීම හෝ පිටවීම වළක්වාලීම සහ එකී තොරතුරු ආරක්ෂාවට සම්බන්ධ අනෙකුත් ආයතන සමග හුවමාරු කරගැනීම මෙම ඒකකයේ කාර්යයන් වේ.
- මෙම අංශය මගින් තැනැත්තන් වෙළෙඳාම් කරුවන්, වින්දිතයන්, තැනැත්තන් ජාවාරම් කරුවන්, නීති විරෝධී සංක්‍රමණිකයන්, සංවිධානාත්මක අපරාධකරුවන්, ඔවුන් ඒ සඳහා යොදා ගන්නා ගමන් මාර්ගයන් හඳුනා ගැනීම සිදු කරනු ලබයි.
- මගියෙකු රටට ඇතුළු වීමට ප්‍රථමයෙන් ඔහු/ඇය විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ලබාගත යුතු අතර එය අනුමත කිරීමට ප්‍රථමයෙන් ඔවුන් පිළිබඳ සොයා බැලීමක් මෙම ඒකකය විසින් සිදු කරනු ලැබේ.
- මගියෙකු රටට ඇතුළු වන අවස්ථාවේ දී ගුවන් තොටුපළේදී අදාළ මගියා රටට ඇතුළත් කරගත යුතු ද යන්න පිළිබඳ වැඩිදුර පරීක්ෂාවක් කිරීමට ආගමන නිලධාරින්ට මඟපෙන්වීමක් කිරීම ද, රටට ඇතුළු වූ මගියෙකු ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරන අවස්ථාවක දී විමර්ශන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම හරහා විමර්ශන නිලධාරින්හට සහය දැක්වීම ද මෙම ඒකකය මගින් සිදු කෙරේ.

### 1.5.4.3.4 විදේශීය රැඳවියන් සඳහා වූ මධ්‍යස්ථාන (වැලිසර හා මිරිහාන)

ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටි විදේශිකයින් සහ ශ්‍රී ලංකාව තුළ විවිධ අපරාධ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමෙන් පසු එම විදේශිකයන් මෙරටින් ඉවත් කරන තුරු රඳවා තබා ගැනීම සහ එතෙක් ඔවුන්ගේ මූලික අවශ්‍යතා සැපයීම සහ අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම හා සායනික කටයුතු මෙම රැඳවුම් මධ්‍යස්ථානය මගින් සිදු කරයි.

මෙම විදේශික රැඳවුම් මධ්‍යස්ථානයේ රඳවා තබන විදේශිකයන් වන්නේ:

01. විමර්ශන අංශය මගින් ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලබන විදේශිකයන්
02. අධිකරණ නියෝග මත රටින් පිටුවහල් කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට භාර දෙන විදේශිකයන්
03. ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසිය මගින් අත්අඩංගුවට ගනු ලබන විදේශිකයන්
04. ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ස්වෙච්ඡාවෙන් දෙපාර්තමේන්තුව වෙත භාර වන විදේශිකයන්

### 1.5.4.3.5 දේශසීමා ආවේක්ෂණ ඒකකය (BORDER SURVEILLANCE UNIT)

සංවිධානාත්මක අපරාධ ලෙස සැලකෙන මිනිස් වෙළෙඳාම හා මිනිස් ජාවාරම අවම කිරීම හා වීසා අවභාවිතාවන් පිළිබඳ විමර්ශනයන්ට අවශ්‍ය සහය ලබා දීමේ අරමුණ ඇතිව ඉහත ඒකකය 2019 ජූලි මාසයේදී කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ තුළ ස්ථාපිත කරන ලදී.

**ඉටුකරන කාර්යයන්**

- මෙමගින් තැනැත්තන් වෙළෙඳාම් කරුවන් හා වින්දිතයන්, තැනැත්තන් ජාවාරම්කරුවන් හා සංචාරක වීසාවන් අවභාවිතා කරන්නන් හඳුනාගැනීම තීව්‍ර කිරීම සිදු කෙරේ. මෙම ඒකකය විසින් සොයාගනු ලබන බුද්ධි තොරතුරු විමර්ශන ඒකකය හා මිනිස් ජාවාරම තුරන් කිරීමට ජාතික සම්පත් මධ්‍යස්ථානය වෙත සන්නිවේදනය කිරීම තුළින් තැනැත්තන් වෙළෙඳාම /ජාවාරම හෝ වෙනත් සංවිධානාත්මක අපරාධ පිළිබඳ විමර්ශන කටයුතු සිදු කෙරේ. එමෙන්ම විමර්ශන ඒකකය විසින් සොයාගනු ලබන බුද්ධි තොරතුරු මෙම ඒකකයට සන්නිවේදනය කිරීම තුළින් අදාළ තොරතුරු පිළිබඳ ගුවන් තොටුපළේ නිලධාරීන්ගේ දැඩි සුපරීක්ෂාවට ලක්කෙරේ.

- අවිධිමත් සංක්‍රමණය හෝ තැනැත්තන් වෙළඳාම සම්බන්ධව කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ පරිශ්‍රයේදී දේශීය හෝ විදේශීය මගින් සිදු කරන වැරදි හඳුනා ගැනීම, නීතිමය කටයුතු සඳහා යොමු කිරීම වැනි කාර්යයන් මෙම අංශය විසින් සිදු කරන අතර 2021 වර්ෂය සඳහා පැමිණීමේ පර්යන්තයේදී හඳුනාගත් සිදුවීම් 15කුත් පිටවීමේ පර්යන්තයේදී හඳුනාගත් සිදුවීම් 37කුත් වාර්තා වූ අතර ඒ සම්බන්ධයෙන් අදාළ කාර්යයන් කරන ලදී.

- මෙම ඒකකයට අදාළව පිහිටුවා ඇති ලියකියවිලි පරීක්ෂණාගාරය (Document Lab) මගින් නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් ලියකියවිලිවල නිරවද්‍යතාවය තහවුරු කර ගන්නා අතර එම තත්ත්වයන් මෙම දෙපාර්තමේන්තු නිලධාරීන්ට මෙන්ම ගුවන් සේවා සමාගම් හා අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ද ලබාදෙනු ලැබේ.





### 1.5.5 තොරතුරු තාක්ෂණ අංශය

පාලක (තොරතුරු තාක්ෂණ) ගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.
නව ක්‍රමවේද හඳුන්වා දෙමින් දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතිය වැඩි දියුණු කිරීම තුළින් මහජනතාවට උපරිම සේවයක් සැලසීම මෙම අංශයේ මූලික වගකීමයි. මීට අමතරව දැනට පවත්නා මෘදුකාංග හා දෘඩාංග බාධාවකින් තොරව පවත්වා ගෙන යාම ද තොරතුරු තාක්ෂණ අංශය මගින් සිදු වේ.

එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සඳහා සේවා සපයන බාහිර ආයතන සමඟ නිසි පරිදි ගිවිසුම් යාවත්කාලීන කිරීම සහ ගිවිසුම් ප්‍රකාරව කටයුතු පවත්වාගෙන යාම අධීක්ෂණය කිරීම ද මෙම අංශයේ තවත් කර්තව්‍යයක් වේ.

ඉහතින් දැක්වූ මූලික කාර්ය භාරයන්ට අමතරව පහත දැක්වෙන විශේෂිත කාර්යයන්ද තොරතුරු තාක්ෂණ අංශය මගින් ඉටු කරනු ලැබේ.

- දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව පරිදි දත්ත පද්ධති හා මෘදුකාංග සංවර්ධනය කරමින් අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම.
- දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
- පවතින දෘඩාංග හා මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරීම(Upgrade).
- උසාවි නියෝග මත මගී ගුවන් ගමන් පිළිබඳව අවශ්‍ය කටයුතු යාවත්කාලීන කිරීම.
- පාලක (ගමන් බලපත්) ගේ නියෝග පරිදි ගමන් බලපත් අසාදු ලේඛනගත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

මෙම අංශය යටතේ පහත ඒකකයන් ද ක්‍රියාත්මකය.

### 1.5.5.1 අස්ථානගත වූ, සොරකම් කරන ලද ගමන්බලපත්‍ර ඒකකය (SLTD)

අස්ථානගත වූ හෝ සොරකම් කරන ලද ගමන්බලපත්‍ර පිළිබඳව පොලිස් ස්ථාන විසින් ලබා දෙන තොරතුරු මධ්‍යම තොරතුරු කාර්යාංශය හෝ විදේශ දූත මණ්ඩල කාර්යාල විසින් සෘජුවම හෝ දෙපාර්තමේන්තුව වෙත තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලැබේ. ඒවා විමර්ශනය කොට, එම ගමන් බලපත්‍ර නැවත පරිහරණය කළ නොහැකි පරිදි අවලංගු කර, අදාළ තොරතුරු ජාත්‍යන්තර පොලීසිය (INTERPOL) වෙත යවනු ලබයි. එවැනි ගමන් බලපත්‍රයක් මගින් වෙනත් පුද්ගලයෙකු විදේශගත වීම වැළැක්වීමට පියවර ගෙන ඇති අතර, එවැනි නීති විරෝධී කටයුතු සිදුවීම වැළැක්වීම (SLTD) පද්ධතියේ මූලික අරමුණ වේ.

2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා අදාළ තොරතුරු මධ්‍යම තොරතුරු කාර්යාංශය (NCB) හා විදේශීය දූත මණ්ඩල(SLDM)විසින් ගමන් බලපත්‍ර 4961ක් දෙපාර්තමේන්තුවට එවා ඇති අතර ගමන් බලපත්‍ර 3646 ක් පිළිබඳ තොරතුරු ජාත්‍යන්තර පොලීසියේ දත්ත පද්ධතිය වෙත යොමු කර තිබේ. ඉතිරි ගමන් බලපත්‍ර නැවත අයදුම්කරුවන් වෙත ලැබුණු බවට වාර්තා වී ඇත.

### 1.5.5.2 ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS)

ආගමන විගමන තොරතුරු හා සංඛ්‍යාලේඛන ලබා දීම සඳහා ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS) ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ තානාපති කාර්යාලයයන් සෘජුව සම්බන්ධතා පවත්වන්නේ මෙම අංශය සමඟ වන අතර අවශ්‍ය විටකදී වීසා නිකුත් කිරීමට පෙර විදේශ ගමන් බලපත් පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම මෙම අංශය හරහා කරනු ලබයි. 2021.01.01 සිට 2021.12.31 දින දක්වා මෙවැනි විමසුම් 268ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

### 1.5.5.3 නැවත භාරගැනීමේ ගැටලු කළමනාකරණ පද්ධතිය. (RCMS)

විදේශයකදී පිටුවහල් කරන ශ්‍රී ලාංකිකයින් සඳහා ඒ ඒ රටවල පිහිටි තානාපති කාර්යාල මගින් ඔවුන්ට අදාළ තොරතුරු ඒ සම්බන්ධයෙන් ස්ථාපිත කර ඇති පරිගණක පද්ධතිය මගින් මෙම දෙපාර්තමේන්තුවට යොමු කරයි. එම පරිගණක පද්ධතිය තුළින්ම දෙපාර්තමේන්තුව සතු ගමන් බලපත් දත්ත සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ

දෙපාර්තමේන්තුවේ දත්ත උපයෝගී කර ගෙන අවසාන වශයෙන්, පුද්ගලයාගේ ශ්‍රී ලාංකිකභාවය තහවුරු කිරීම කරනු ලබන අතර ඉන් පසු තාවකාලික ගමන් ලියවිල්ලක් නිකුත් කිරීම සඳහා නිර්දේශය ලබා දෙනු ලැබේ.

**2021 වසරේ සිදු කළ විශේෂ වැඩසටහන්**

- ආගමන හා විගමන බුද්ධි අංශය, ප්‍රත්‍යන්ත ආවේක්ෂණ ඒකකය, දෙපාර්තමේන්තු මාර්ගගත පද්ධතිය හා මෘදුකාංග වැඩි දියුණු කිරීම.
- පුරවැසි හා විදේශ දූත මණ්ඩල අංශයන්හි අයදුම්පත් මාර්ගගත ක්‍රමයට ලබා ගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීම.
- සංඛ්‍යාන වාර්තා හා උපකරණ පුවරුව වැඩිදියුණු කිරීම. (Statistical Report Generation and Dashboard module)
- අන්තර්ජාතික පොලිසිය සමඟ වන සම්බන්ධතාවය යාවත්කාලීන කිරීම.

### 1.5.6 පුරවැසි අංශය

මෙම අංශයේ කටයුතු ක්‍රියාත්මක වනු ලබන්නේ 1948 අංක 18 දරන පුරවැසි පනතින් ලද ව්‍යවස්ථාපිත බලය යටතේය. පුරවැසි පනත ක්‍රියාත්මක කිරීමේ විධායක නිල බලය ලැබෙන්නේ අදාළ රේඛීය අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ලේකම්වරයාට වන අතර අමාත්‍යාංශ ලේකම්වරයාගේ විධායක බලතල සහකාර ලේකම්වරයකු මගින් ක්‍රියාත්මක වන අතර එම බලතල ද පුරවැසි අංශයේ නියෝජ්‍ය පාලකවරයකු මගින් ක්‍රියාත්මක වේ. පුරවැසි පනතේ ප්‍රතිපාදන සහ විධායක ක්‍රියාපටිපාටි, ආගාමික හා විගාමික පනතින් පාලනය වන, විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සමඟ සෘජුවම සම්බන්ධ වන නිසා පුරවැසි අංශය ආගමන හා විගමන දෙපාර්මේන්තුවෙහි ස්ථාපිත කර ඇත.

### 1.5.7 ගිණුම් අංශය

ප්‍රධාන ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ ගණකාධිකාරි (වියදම්) සහ ගණකාධිකාරි (ආදායම්) ගේ මෙහෙය වීම යටතේ, ගෙවීම් අංශය, අයවැය අංශය, පරිගණක අංශය සහ ආදායම් අංශය ලෙස ගිණුම් කටයුතු ක්‍රියාත්මක වේ.

**කාර්යභාරය**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණය ගිණුම් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් වන මෙහි ආදායම් එකතු කිරීම, ගිණුම් ගත කිරීම සහ අධීක්ෂණය, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කළමනාකරණය සහ දෙපාර්තමේන්තුවට අයත් වත්කම් කළමනාකරණය සිදුකරයි. මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වියදම්, අනුමත ප්‍රතිපාදන සීමාවන්ට යටත්ව වියදම් දැරීම සඳහා මඟපෙන්වීම සිදුකරන අතර වාර්ෂික සහ මාසික වාර්තාවන් (වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව, විසර්ජණ ගිණුම සහ මාසික ගිණුම් සාරාංශ) පිළියෙල කර නියමිත දිනයන්හි මහා භාණ්ඩාගාරය හා අදාළ අනෙකුත් දෙපාර්තමේන්තු සහ ආයතන වෙත ඉදිරිපත් කිරීම ඇතුලු දෙපාර්තමේන්තුවේ සියලුම මූල්‍ය කටයුතු මෙහෙයවීම සහ කළමනාකරණය කිරීම ගිණුම් අංශය තුළින් සිදුවේ.

**(අ) ආදායම**

2021 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත මුළු ආදායම් ඉලක්කය රුපියල් බිලියන 19.67 ක් වූ නමුත් 2021 වර්ෂයේ කොරෝනා වසංගතය නිසා ඇති වූ අනපේක්ෂිත තත්ත්වය හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායම් ඉලක්කය රුපියල් බිලියන 5.67 දක්වා සංශෝධනය කිරීමට සිදුවිය. එම ආදායම් ඉලක්කය පැවති ආදායම් ඉපයීමේ හැසිරීම මත පූර්වකතනය කරන ලද්දක් වුවද, එම ආදායම් සීමාව ඉක්මවා යමින් 2021 වර්ෂයේ සත්‍ය වශයෙන්

උපයන ලද මුලු ආදායම රුපියල් බිලියන 8.66 වාර්තා විය. 2021 වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව සිව්වන කාර්තුව තුළදී සියලුම ආදායම් ප්‍රභවයන් ඉහළ වර්ධනයක් පෙන්නුම් කිරීම මෙම මුලු ආදායම ඉහළ යාමට හේතු විය. මෙය 2020 වර්ෂයේ උපයන ලද මුලු ආදායම වන රුපියල් බිලියන 5.53 සමග සැසඳීමේදී එම වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂය තුළ රුපියල් බිලියන 3.13 ආදායම් ඉපයීමේ වර්ධනයක් ලෙස සටහන් වීමකි.

**(ආ) වියදම**

2021 වර්ෂයේ දෙපාර්තමේන්තු වියදම් සඳහා ඇස්තමේන්තුගත (සංශෝධිත) ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 3,137.80ක් විය. එම ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 1,927.30ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන්ද, රුපියල් මිලියන 1,210.50ක් මූලධන වියදම් වෙනුවෙන්ද වෙන්කරන ලදී. 2021 වර්ෂයේ සමස්ථ සත්‍ය වියදම රුපියල් මිලියන 2,675.33ක් වු අතර එයින් රුපියල් මිලියන 1,712.25ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන්ද, රුපියල් මිලියන 963.08ක් මූලධන වියදම් වෙනුවෙන්ද වැය කර ඇත. සමස්ත මූලධන වියදම් වලින් රුපියල් මිලියන 100.00 අනිවාර්ය ඉතිරි කිරීම් වශයෙන් රඳවාගැනීමට යටත්ව මෙම වියදම වාර්තා වී තිබේ.

### 1.5.8 අභ්‍යන්තර විගණන අංශය

ප්‍රධාන අභ්‍යන්තර විගණක ගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

**අරමුණ**

දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා මඟ පෙන්වනු ලබන ස්වාධීන සහතික කිරීම් හා උපදේශනයන් සැපයීම.

**අභ්‍යන්තර විගණනයේ විෂය පථය**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව හා ඒ යටතේ ඇති සියලුම අංශ යටතට ගැනෙන සියලුම ක්ෂේත්‍ර සමාලෝචනය කිරීම, එම සමාලෝචනය කිරීමට අවශ්‍ය වාර්තා හා ලිපි ලේඛන පරීක්ෂා කිරීම සහ ගබඩා හා පුද්ගලයන් වෙත ප්‍රවේශ වීම.

**2021 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්**

- සිදු කරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණ

i. දෙපාර්තමේන්තුවේ වාහන භාවිතය පිළිබඳ පරීක්ෂාව.

ii. 2021 ජනවාරි මස ගෙවීම් වවුචර් පරීක්ෂාව.

iii. 2021 මාර්තු මස ගෙවීම් වවුචර් පරීක්ෂාව.

iv. විශේෂ විගණන පරීක්ෂාව - කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය.

v. දෙපාර්තමේන්තුවේ පවිත්‍රතා සේවා සම්බන්ධ අභ්‍යන්තර විගණන පරීක්ෂණය.

vi. ආයතනයේ යන්ත්‍ර හා උපකරණ නඩත්තු හා සේවා කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂණය.

vii. වැටුප් ගෙවීමට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය පරීක්ෂා කිරීම.

viii. දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර හා උපකරණ නඩත්තුව, සේවා කිරීම, අළුත්වැඩියා හා සේවා ගිවිසුම් අලුත් කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණන පරීක්ෂණය.

ix. දෙපාර්තමේන්තුවේ 2020 වර්ෂය සම්බන්ධයෙන් සකස්කල අත්තිකාරම් බී ගිණුම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය.

x. ලංකා බැංකුව බම්බලපිටිය ශාඛාවේ ගිණුම් අංක 70414423 දරන ගිණුමට අදාළව බැංකු සැසඳුම් පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය.

- ඉදිරිපත් කරන ලද විශේෂ වාර්තා

i. 2021 ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ මූලික වාර්තාව සකස් කිරීම.

ii. 2021 වර්ෂයේ පළමු කාර්තුවට අදාළ ආදායම් විශ්ලේෂණ වාර්තාව සකස් කිරීම.

iii. 2021 වර්ෂයේ පළමු කාර්තුවට අදාළ වියදම් විශ්ලේෂණ වාර්තාව සකස් කිරීම.

iv. 2021 වර්ෂයේ දෙවන කාර්තුවට අදාළ ආදායම් විශ්ලේෂණ වාර්තාව සකස් කිරීම.

v. 2021 වර්ෂයේ දෙවන කාර්තුවට අදාළ වියදම් විශ්ලේෂණ වාර්තාව සකස් කිරීම.

vi. 2021 වර්ෂයේ තෙවන කාර්තුවට අදාළ ආදායම් විශ්ලේෂණ වාර්තාව සකස් කිරීම.

vii. 2021 වර්ෂයේ තෙවන කාර්තුවට අදාළ වියදම් විශ්ලේෂණ වාර්තාව සකස් කිරීම.

viii. 2021 වර්ෂයේ පළමු කාර්තුවට අදාළ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්තුමය ඇගයීම් වාර්තාව සකස් කිරීම.

ix. 2021 වර්ෂයේ දෙවන කාර්තුවට අදාළ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්තුමය ඇගයීම් වාර්තාව සකස් කිරීම.

x. 2021 වර්ෂයේ තෙවන හා සිව්වන කාර්තුවලට අදාළ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්තුමය ඇගයීම් වාර්තාව සකස් කිරීම.

- කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම

- වෙනත් විශේෂ කාර්යයන්

i. වාර්ෂික ගිණුම් පරීක්ෂාව - දෙපාර්තමේන්තුවේ සුභසාධක සංගමය.

ii. 2021 සංශෝධිත අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. (2021 දෙසැම්බර්)

iii. 2022 අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.

# 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරිදැක්ම

## 2.1 2021 වර්ෂයේදී අත්කරගත් ප්‍රගතිය

### 2.1.1. ගමන් බලපත්‍ර අංශය

#### 2.1.1.1 ගමන් බලපත් නිකුත් කිරීමේ ප්‍රගතිය

(1) 2021 වර්ෂයේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද සියලුම ගමන් බලපත්‍ර සංඛ්‍යාව

| රාජ්‍ය තාන්ත්‍රික | රාජකාරී | සියලු රටවල් | හදිසි සහතික | හඳුනාගැනීමේ සහතික | එකතුව |
|---|---|---|---|---|---|
| 398 | 860 | 381,301 | 1 | - | 382,560 |

(2) ප්‍රාදේශීය කාර්යාල මගින් නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව

| කාර්යාලය | රාජ්‍ය තාන්ත්‍රික | රාජකාරී | සියලු රටවල් | හදිසි සහතික | එකතුව |
|---|---|---|---|---|---|
| මහනුවර | 1 | 2 | 27,392 | 0 | 27,395 |
| වවුනියාව | 0 | 0 | 22,708 | 0 | 22,708 |
| මාතර | 0 | 0 | 20,753 | 1 | 20,754 |
| කුරුණෑගල | 0 | 0 | 22,306 | 0 | 22,306 |
| එකතුව | 1 | 2 | 93,159 | 1 | 93,163 |



(3) 2017 සිට 2021දක්වා ගමන් බලපත් නිකුත් කිරීම් (ගමන් බලපත් වර්ග අනුව)

| වර්ෂය | රාජ්‍යතාන්ත්‍රික | රාජකාරී | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික | හඳුනාගැනීමේ සහතික | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2017 | 339 | 1,819 | 369,197 | 173,901 | 17,787 | 1 | 563,044 |
| 2018 | 364 | 1,934 | 392,317 | 187,869 | 21,246 | 2 | 603,732 |
| 2019 | 314 | 1,585 | 545,883 | 3,916 | 19,674 | 1 | 571,373 |
| 2020 | 175 | 404 | 204,081 | 13 | 4,738 | 0 | 209,411 |
| 2021 | 398 | 860 | 381,301 | - | 1 | - | 382,560 |
| එකතුව | 1,590 | 6,602 | 1,892,779 | 365,699 | 63,446 | 4 | 2,330,120 |




(4) 2017 සිට 2021දක්වා ප්‍රාදේශීය කාර්යාල මගින් නිකුත් කළ ගමන් බලපත් සංඛ්‍යාව

| කාර්යාලය | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| මහනුවර | 42,793 | 42,364 | 45,982 | 16,230 | 27,395 |
| වවුනියාව | 21,192 | 23,856 | 29,820 | 12,269 | 22,708 |
| මාතර | 24,722 | 26,704 | 32,109 | 11,353 | 20,754 |
| කුරුණෑගල | 3,709 | 19,336 | 29,589 | 11,451 | 22,306 |
| එකතුව | 92,416 | 112,260 | 137,500 | 51,303 | 93,163 |




### 2.1.1.2 ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව

(1) ප්‍රධාන කාර්යාලය මගින් සිදු කළ ගමන් බලපත්‍ර සංශෝධන - 2021

| කාණ්ඩය | එකතුව |
|---|---|
| එක් විදේශ ගමනකට වලංගු කිරීම | 143 |
| තනි ගමන් සීමාව අවලංගු කිරීම | 1,262 |
| ද්විත්ව පුරවැසිභාවය ඇතුළත් කිරීම | 61 |
| දරුවන්ගේ විස්තර ඉවත් කිරීම | 28 |
| හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම | 2,119 |
| විවාහයට පෙර නම යෙදීම | 70 |
| නම වෙනස් කිරීම | 2,216 |
| විවාහයට පසු නම යෙදීම | 294 |
| වෙනත් සංශෝධන 01 | 3,000 |
| වෙනත් සංශෝධන 02 | 35 |
| තනතුර සටහන් කිරීම | 12,193 |
| විවාහයට පෙර නම යෙදීම | 3 |
| එකතුව | 21,424 |

(2) ප්‍රාදේශීය කාර්යාලය මඟින් සිදු කළ ගමන් බලපත්‍ර සංශෝධන - 2021

| කාණ්ඩය | මහනුවර | වවුනියාව | මාතර | කුරුණෑගල |
|---|---|---|---|---|
| එක් විදේශ ගමනකට වලංගු කිරීම | 1 | 4 | - | 11 |
| තනි ගමන් සීමාව අවලංගු කිරීම | 67 | 52 | 55 | 55 |
| ද්විත්ව පුරවැසිභාවය ඇතුළත් කිරීම | 4 | - | 2 | 3 |
| දරුවන්ගේ විස්තර ඉවත් කිරීම | 1 | 1 | 3 | 1 |
| හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම | 172 | 106 | 127 | 118 |
| විවාහයට පෙර නම යෙදීම | 1 | 31 | 1 | 276 |
| නම වෙනස් කිරීම | 342 | 212 | 133 | 3 |
| විවාහයට පසු නම යෙදීම | 8 | 188 | - | 163 |
| වෙනත් සංශෝධන 01 | 173 | 97 | 79 | 2 |
| වෙනත් සංශෝධන 02 | 2 | 2 | - | - |
| තනතුර සටහන් කිරීම | 926 | 463 | 433 | 2,256 |
| අලුත්කිරීම් | - | 1 | - | - |
| එකතුව | 1,697 | 1,157 | 833 | 2,888 |

### 2.1.1.3 විදේශ දූත මණ්ඩල ශාඛාවේ ප්‍රගතිය

2021 වර්ෂය තුළ මෙම ශාඛාව මගින් නිකුත් කරන ලද ගමන් බලපත් සංඛ්‍යාව

| මාසය | සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 1,983 |
| පෙබරවාරි | 2,793 |
| මාර්තු | 6,148 |
| අප්‍රේල් | 3,411 |
| මැයි | 6,582 |
| ජූනි | 8,815 |
| ජූලි | 5,983 |
| අගෝස්තු | 5,580 |
| සැප්තැම්බර් | 4,011 |
| ඔක්තෝබර් | 5,956 |
| නොවැම්බර් | 4,186 |
| දෙසැම්බර් | 5,440 |
| එකතුව | 60,888 |

(2) 2017 වර්ෂයේ සිට 2021 වසර දක්වා විදේශ දූත මණ්ඩල ශාඛාව මගින් නිකුත් කරන ලද ගමන් බලපත් පිළිබඳ තොරතුරු

| මාසය | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| ජනවාරි | 3,043 | 3,221 | 3,785 | 3,610 | 1,983 |
| පෙබරවාරි | 3,457 | 3,241 | 2,681 | 4,370 | 2,793 |
| මාර්තු | 4,603 | 3,786 | 4,035 | 2,243 | 6,148 |
| අප්‍රේල් | 4,038 | 3,760 | 4,088 | 3,112 | 3,411 |
| මැයි | 4,532 | 6,501 | 5,448 | 1,935 | 6,582 |
| ජුනි | 4,614 | 3,298 | 3,858 | 3,147 | 8,815 |
| ජූලි | 3,752 | 6,025 | 3,684 | 3,155 | 5,983 |
| අගෝස්තු | 4,167 | 3,763 | 3,778 | 3,630 | 5,580 |
| සැප්තැම්බර් | 3,358 | 3,377 | 3,593 | 5,583 | 4,011 |
| ඔක්තෝබර් | 2,805 | 4,785 | 4,052 | 5,290 | 5,956 |
| නොවැම්බර් | 4,016 | 3,402 | 3,142 | 4,331 | 4,186 |
| දෙසැම්බර් | 3,162 | 3,633 | 2,950 | 2,795 | 5,440 |
| එකතුව | 45,547 | 48792 | 45,094 | 43,201 | 60,888 |



### 2.1.2 වීසා හා ප්‍රත්‍යන්ත පාලන අංශය

#### 2.1.2.1 වීසා ශාඛාව

**(1) 2021 වර්ෂය තුළ විද්‍යුත් සංචරණ අනුමැතීන් ලබා දීම්, නව වීසා නිකුත් කිරීම් සහ දීර්ඝ කිරීම්වලට අදාළ ප්‍රගතිය.**

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| ඉ - සංචරණ අනුමැතිය ලබා දීම් | 234313 |
| වාස වීසා නිකුත් කිරීම් | 15809 |
| වාස වීසා දීර්ඝ කිරීම් | 28595 |
| කෙටි කාලීන වීසා දීර්ඝ කිරීම් (සංචාරක , ව්‍යාපාරික සහ බහුවාර පිවිසුම් වීසා) | 20246 |
| ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම හේතුවෙන් වීසා අවශ්‍යතාවයෙන් මුදා හැරීම් (ශ්‍රී ලාංකික) | 468 |



## (2) වාස වීසා දීර්ඝ කිරීම් හා නිකුත් කිරීම් පිළිබඳ විස්තරාත්මක සටහන - 2021

| වාස වීසා වර්ගය | දීර්ඝ කිරීම් | නිකුත් කිරීම් | තානාපති කාර්යාල වෙත යවනු ලැබූ ෆැක්ස් පණිවුඩ | ගුවන් තොටුපළ වෙත යවනු ලැබූ පණිවුඩ (Landing Endorsement) |
|---|---|---|---|---|
| ආයෝජන මණ්ඩල වල සේවයේ නියුතු | 6,654 | 2,638 | 2,391 | 1,626 |
| ශ්‍රී ලාංකික දෙමාපියන්ගේ දරුවන් | 365 | 354 | 0 | 0 |
| පුරවැසි පනතේ 5.2 වගන්තිය යටතේ | 103 | 131 | 0 | 0 |
| පුරවැසි පනතේ 11 වගන්තිය යටතේ | 65 | 66 | 0 | 0 |
| පූජ්‍ය පක්ෂය | 1,202 | 95 | 81 | 20 |
| උසාවි නියෝග | 217 | 37 | 0 | 0 |
| රාජ්‍යතාන්ත්‍රික | 342 | 374 | 342 | 208 |
| කලින් ශ්‍රී ලාංකිකයින්ව සිටි | 1,859 | 1,923 | 0 | 0 |
| වෛද්‍ය හේතූන් මත පැමිණි | 675 | 386 | 6 | 2 |
| රාජ්‍ය නොවන සංවිධාන(NGO+INGO) | 374 | 250 | 244 | 95 |
| රාජ්‍ය අංශයේ සේවයට පැමිණි | 188 | 252 | 82 | 46 |
| පුද්ගලික අංශයේ සේවයේ නියුතු | 4,839 | 4,355 | 2,686 | 1,295 |
| ලියාපදිංචි ඉන්දියානුවන් | 6 | 1 | 0 | 0 |
| ආගමික කාර්යයන් සඳහා පැමිණි | 123 | 31 | 78 | 4 |
| දීර්ඝ කාලීන නේවාසික වීසා (වසර 05) (RGS) | 11 | 0 | 0 | 0 |
| ද්විත්ව පුරවැසි (පිටසන් කිරීම) | 129 | 303 | 0 | 0 |
| ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ කලත්‍රයන් | 4,356 | 1,202 | 0 | 0 |
| සේවයේ නියුතු විදේශීය කලත්‍රයන් | 0 | 1 | 0 | 0 |
| SSRV (My Dream Home) | 223 | 46 | 0 | 0 |
| රාජකාරි | 2,261 | 2,472 | 1,703 | 1,468 |
| ශිෂ්‍ය / ශිෂ්‍යත්වලාභින් | 4,593 | 837 | 434 | 224 |
| ඉදිකිරීම් ක්ෂේත්‍රයන් | 0 | 0 | 0 | 0 |
| ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ යැපෙන්නන් | 10 | 3 | 0 | 0 |
| SAARC වීසා | 0 | 52 | 0 | 0 |
| එකතුව | 28,595 | 15,809 | 8,047 | 4,988 |

## 2.1.2.2. තොටුපළ ශාඛාව

(1) අනුමත එක් එක් තොටුපළ හරහා පැමිණි හා පිටත් වූ පුද්ගලයින් සංඛ්‍යාව - 2021

| තොටුපල | පැමිණි සංඛ්‍යාව | පිටත් වූ සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපළ | 561,890 | 476,831 | 1,038,721 |
| හම්බන්තොට වරාය | 463 | 279 | 742 |
| මත්තල ගුවන් තොටුපළ | 17,971 | 15,321 | 33,292 |
| කොළඹ වරාය | 3,415 | 3,965 | 7,380 |
| ගාල්ල වරාය | 14,375 | 12,545 | 26,920 |
| නොරොච්චෝලේ වරාය | 66 | 64 | 130 |
| ත්‍රිකුණාමලය වරාය | 681 | 678 | 1,359 |
| රත්මලාන ගුවන් තොටුපළ | 20 | 18 | 38 |
| යාපනය ගුවන් තොටුපළ | 0 | 0 | 0 |
| එකතුව | 598,881 | 509,701 | 1,108,582 |







(2) ශ්‍රී ලංකාවට පැමිණි හා පිටවූ ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව මාසිකව - 2021

| මාසය | පැමිණි සංඛ්‍යාව | | | පිටත් වූ සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | ශ්‍රී ලාංකික පුරවැසියන් | විදේශිකයන් | පැමිණි මුළු සංඛ්‍යාව | ශ්‍රී ලාංකික පුරවැසියන් | විදේශිකයන් | පිටත්වූ මුළු සංඛ්‍යාව |
| ජනවාරි | 11,365 | 4,214 | 15,579 | 9,881 | 5,177 | 15,058 |
| පෙබරවාරි | 15,275 | 6,606 | 21,881 | 11,177 | 5,378 | 16,555 |
| මාර්තු | 20,521 | 8,632 | 29,153 | 13,375 | 7,198 | 20,573 |
| අප්‍රේල් | 26,424 | 8,683 | 35,107 | 14,327 | 7,971 | 22,298 |
| මැයි | 15,280 | 4,586 | 19,866 | 11,629 | 7,406 | 19,035 |
| ජූනි | 24,779 | 3,897 | 28,676 | 7,560 | 5,037 | 12,597 |
| ජූලි | 21,461 | 6,589 | 28,050 | 10,710 | 6,079 | 16,789 |
| අගෝස්තු | 23,867 | 9,896 | 33,763 | 19,917 | 8,395 | 28,312 |
| සැප්තැම්බර් | 22,472 | 18,669 | 41,141 | 34,508 | 16,914 | 51,422 |
| ඔක්තෝබර් | 40,868 | 29,547 | 70,415 | 46,796 | 21,935 | 68,731 |
| නොවැම්බර් | 51,665 | 52,124 | 103,789 | 55,527 | 41613 | 97,140 |
| දෙසැම්බර් | 70,758 | 100,703 | 171,461 | 73,827 | 67,364 | 141,191 |
| එකතුව | 344,735 | 254,146 | 598,881 | 309,234 | 200,467 | 509,701 |




(3) ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයන් සංඛ්‍යාව කලාප අනුව - 2021

| මාසය | අප්‍රිකාව | ආසියාව | ඕස්ට්‍රේලියාව | යුරෝපය | උතුරු ඇමරිකාව | දකුණු ඇමරිකාව | හඳුනා නොගත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 46 | 1,655 | 66 | 2,305 | 136 | 2 | 4 | 4,214 |
| පෙබරවාරි | 52 | 3,588 | 80 | 2,583 | 291 | 11 | 1 | 6,606 |
| මාර්තු | 102 | 5,143 | 82 | 2,852 | 433 | 15 | 5 | 8,632 |
| අප්‍රේල් | 113 | 4,966 | 117 | 2,779 | 680 | 21 | 7 | 8,683 |
| මැයි | 48 | 2,373 | 68 | 1,708 | 369 | 16 | 4 | 4,586 |
| ජූනි | 37 | 1,986 | 52 | 1,447 | 367 | 2 | 6 | 3,897 |
| ජූලි | 85 | 3,197 | 75 | 2,447 | 775 | 1 | 9 | 6,589 |
| අගෝස්තු | 102 | 4,532 | 96 | 3,878 | 1,255 | 15 | 18 | 9,896 |
| සැප්තැම්බර් | 117 | 14,366 | 67 | 3,448 | 641 | 16 | 14 | 18,669 |
| ඔක්තෝබර් | 142 | 17,378 | 249 | 10,031 | 1,710 | 23 | 14 | 29,547 |
| නොවැම්බර් | 388 | 26,648 | 1,461 | 20,448 | 3,033 | 112 | 34 | 52,124 |
| දෙසැම්බර් | 816 | 40,393 | 4,401 | 49,106 | 5,729 | 222 | 36 | 100,703 |
| එකතුව | 2,048 | 126,225 | 6,814 | 103,032 | 15,419 | 456 | 152 | 254,146 |



## (4) ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව තොටුපළ හා මාස අනුව - 2021

| තොටුපළ | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපළ | 10,488 | 14,185 | 19,718 | 26,028 | 15,017 | 24,503 | 21,220 | 23,557 | 22,194 | 40,617 | 51,325 | 70,464 | 339,316 |
| හම්බන්තොට වරාය | 6 | 177 | 0 | 3 | 0 | 0 | 1 | 1 | 0 | 3 | 8 | 13 | 212 |
| මත්තල ගුවන් තොටුපළ | 593 | 688 | 557 | 137 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1975 |
| කොළඹ වරාය | 51 | 73 | 70 | 100 | 55 | 85 | 52 | 135 | 34 | 42 | 153 | 85 | 935 |
| ගාල්ල වරාය | 227 | 143 | 174 | 156 | 203 | 189 | 164 | 171 | 232 | 202 | 171 | 169 | 2,201 |
| නොරොච්චෝලේ වරාය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ත්‍රිකුණාමලය වරාය | 0 | 9 | 2 | 0 | 5 | 2 | 24 | 3 | 12 | 4 | 8 | 11 | 80 |
| රත්මලාන ගුවන් තොටුපළ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 16 | 16 |
| යාපනය ගුවන් තොටුපළ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| එකතුව | 11,365 | 15,275 | 20,521 | 26,424 | 15,280 | 24,779 | 21,461 | 23,867 | 22,472 | 40,868 | 51,665 | 70,758 | 344,735 |

## (5) ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයින් සංඛ්‍යාව තොටුපළ හා මාස අනුව - 2021

| තොටුපළ | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපළ | 1,476 | 2,937 | 5,052 | 6,275 | 2,427 | 2,157 | 4,379 | 7,701 | 15,705 | 26,627 | 50,057 | 97,781 | 222,574 |
| හම්බන්තොට වරාය | 26 | 24 | 65 | 24 | 20 | 1 | 0 | 14 | 9 | 7 | 25 | 36 | 251 |
| මත්තල ගුවන් තොටුපළ | 2,011 | 2,968 | 2,443 | 1,296 | 905 | 656 | 891 | 868 | 1,350 | 1,423 | 355 | 830 | 15,996 |
| කොළඹ වරාය | 14 | 26 | 54 | 143 | 276 | 180 | 153 | 247 | 253 | 319 | 388 | 427 | 2,480 |
| ගාල්ල වරාය | 687 | 651 | 1,018 | 927 | 920 | 821 | 1,066 | 969 | 1,211 | 1,111 | 1,221 | 1,572 | 12,174 |
| නොරොච්චෝලේ වරාය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 23 | 10 | 10 | 23 | 66 |
| ත්‍රිකුණාමලය වරාය | 0 | 0 | 0 | 18 | 38 | 82 | 100 | 97 | 118 | 50 | 68 | 30 | 601 |
| රත්මලාන ගුවන් තොටුපළ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 4 | 4 |
| යාපනය ගුවන් තොටුපළ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| එකතුව | 4,214 | 6,606 | 8,632 | 8,683 | 4,586 | 3,897 | 6,589 | 9,896 | 18,669 | 29,547 | 52,124 | 100,703 | 254,146 |

## (6) ශ්‍රී ලංකාවෙන් පිටවූ ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව තොටුපළ හා මාස අනුව - 2021

| තොටුපළ | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපළ | 9,619 | 10,731 | 13,061 | 14,059 | 11,267 | 7,227 | 10,293 | 19,431 | 34,111 | 46,417 | 55,190 | 73,573 | 304,979 |
| හම්බන්තොට වරාය | 6 | 1 | 6 | 0 | 7 | 0 | 0 | 1 | 0 | 2 | 8 | 15 | 46 |
| මත්තල ගුවන් තොටුපළ | 20 | 0 | 11 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 4 | 0 | 0 | 36 |
| කොළඹ වරාය | 50 | 237 | 64 | 75 | 104 | 65 | 86 | 180 | 72 | 80 | 168 | 67 | 1,248 |
| ගාල්ල වරාය | 178 | 207 | 231 | 192 | 247 | 245 | 304 | 238 | 290 | 288 | 152 | 141 | 2,713 |
| නොරොච්චෝලේ වරාය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ත්‍රිකුණාමලය වරාය | 8 | 1 | 2 | 1 | 4 | 23 | 27 | 67 | 34 | 5 | 9 | 17 | 198 |
| රත්මලාන ගුවන් තොටුපළ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 14 | 14 |
| යාපනය ගුවන් තොටුපළ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| එකතුව | 9,881 | 11,177 | 13,375 | 14,327 | 11,629 | 7,560 | 10,710 | 19,917 | 34,508 | 46,796 | 55,527 | 73,827 | 309,234 |

## (7) ශ්‍රී ලංකාවෙන් පිටවූ විදේශිකයින් සංඛ්‍යාව තොටුපළ හා මාස අනුව - 2021

| තොටුපළ | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපළ | 2,622 | 2,047 | 3,840 | 5,421 | 5,536 | 3,546 | 4,196 | 6,484 | 14,405 | 19,330 | 39,658 | 64,767 | 171,852 |
| හම්බන්තොට වරාය | 12 | 1 | 20 | 21 | 10 | 1 | 0 | 40 | 20 | 5 | 42 | 61 | 233 |
| මත්තල ගුවන් තොටුපළ | 1,917 | 2,394 | 2,578 | 1,627 | 756 | 732 | 978 | 874 | 1,251 | 1,321 | 381 | 476 | 15,285 |
| කොළඹ වරාය | 31 | 427 | 37 | 111 | 458 | 96 | 81 | 192 | 174 | 255 | 350 | 505 | 2,717 |
| ගාල්ල වරාය | 595 | 509 | 722 | 775 | 575 | 616 | 756 | 716 | 976 | 979 | 1,109 | 1,504 | 9,832 |
| නොරොච්චෝලේ වරාය | 0 | 0 | 0 | 0 | 32 | 0 | 0 | 0 | 0 | 0 | 10 | 22 | 64 |
| ත්‍රිකුණාමලය වරාය | 0 | 0 | 1 | 16 | 39 | 46 | 68 | 89 | 88 | 45 | 63 | 25 | 480 |
| රත්මලාන ගුවන් තොටුපළ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 4 | 4 |
| යාපනය ගුවන් තොටුපළ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| එකතුව | 5,177 | 5,378 | 7,198 | 7,971 | 7,406 | 5,037 | 6,079 | 8,395 | 16,914 | 21,935 | 41,613 | 67,364 | 200,467 |

(8) රට තුළට ඇතුළුවීමට අවසර නොදුන් විදේශිකයන් (Refused entry)- 2021.

| ජාතිය | ඇතුල්වීමට අවසර නොදුන් විදේශිකයන් ප්‍රමාණය |
|---|---|
| බංග්ලාදේශ | 02 |
| ඉන්දියානු | 22 |
| ඉරාන් | 01 |
| පාකිස්ථානු | 10 |
| චීන | 03 |
| ලෙබනන් | 01 |
| ඇෆ්ගනිස්ථානු | 03 |
| රුසියානු | 01 |
| ඉන්දුනීසියානු | 01 |
| ඇමෙරිකන් | 02 |
| ජර්මානු | 02 |
| බ්‍රිතාන්‍ය | 01 |
| මාලදිවයින් | 03 |
| කැනේඩියානු | 01 |
| නේපාල | 02 |
| තායිලන්ත | 02 |
| නෙදර්ලන්ත | 01 |
| ඊජිප්තු | 02 |
| උස්බෙකිස්ථානු | 02 |
| කිරිගිස්තාන් | 01 |
| සවුදි | 04 |
| ජපාන | 01 |
| දකුණු අප්‍රිකානු | 02 |
| අයිරිෂ් | 01 |
| ඩොමිනිකන් | 01 |
| එකතුව | 72 |

(9) 2021 වර්ෂය තුළදී කුරියර් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති විදේශ දූත මණ්ඩල හරහා ඉදිරිපත් වූ ගමන් බලපත්‍ර සංඛ්‍යාව

| මාසය | කුරියර් කළ ප්‍රමාණය | ආදායම (ඒකක වටිනාකම රු:1150.00) |
|---|---|---|
| ජනවාරි | 152 | 174,800 |
| පෙබරවාරි | 290 | 333,500 |
| මාර්තු | 325 | 373,750 |
| අප්‍රියෙල් | 190 | 218,500 |
| මැයි | 123 | 141,450 |
| ජූනි | 230 | 264,500 |
| ජූලි | 409 | 470,350 |
| අගෝස්තු | 524 | 602,600 |
| සැප්තැම්බර් | 391 | 449,650 |
| ඔක්තෝබර් | 402 | 462,300 |
| නොවැම්බර් | 305 | 350,750 |
| දෙසැම්බර් | 393 | 451,950 |
| එකතුව | 3,734 | 4,294,100 |




(10) ගමන් බලපත්‍ර කූරියර් කිරීමෙන් ලද ආදායම 2014 – 2021

| මාසය | කූරියර් කළ ප්‍රමාණය | ආදායම (ඒකක වටිනාකම රු:1000.00 / රු:1150.00) |
|---|---|---|
| 2014 | 26,286 | 26,286,000 |
| 2015 | 28,820 | 28,820,000 |
| 2016 | 30,676 | 30,676,000 |
| 2017 | 30,529 | 30,529,000 |
| 2018 | 26,718 | 26,718,000 |
| 2019 | 19,334 | 20,376,650 |
| 2020 | 2,422 | 2,785,300 |
| 2021 | 3,734 | 4,294,100 |
| එකතුව | 168,519 | 170,485,050 |



(11) ශ්‍රී ලංකාවේ අනුමත වරායක නැංගුරම් ලා තිබෙන නැවක නාවික කාර්ය මණ්ඩලයට තාවකාලිකව ගොඩබිමට පැමිණීමට අවසර පත්‍ර නිකුත් කිරීම.

| තොටුපල | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ වරාය | 91,122 | 86,753 | 88,158 | 61,664 | 68,844 | 6,941 | 28 | 403,510 |
| ගාල්ල වරාය | 2,177 | 2,269 | 1,341 | 1,596 | 1,246 | 69 | 0 | 8,698 |
| නොරොච්චෝලේ වරාය | -- | -- | -- | 209 | 248 | 86 | 0 | 543 |
| ත්‍රිකුණාමලය වරාය | 105 | 0 | 0 | 2,334 | 1,733 | 315 | 0 | 4,487 |
| හම්බන්තොට වරාය | -- | -- | -- | 345 | 589 | 106 | 12 | 1,052 |
| එකතුව | 93,404 | 89,022 | 89,499 | 66,148 | 72,660 | 7,517 | 40 | 418,290 |

(12) නාවික කාර්ය මණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම - මාසිකව ආදායම 2021

| මාසය | නිකුත් කළ ස්ටිකර් ප්‍රමාණය | ආදායම (රු.)<br>(ඒකක වටිනාකම රු:1150.00) |
|---|---|---|
| ජනවාරි | 1,047 | 1,204,050 |
| පෙබරවාරි | 1,420 | 1,633,000 |
| මාර්තු | 1,735 | 1,995,250 |
| අප්‍රේල් | 2,273 | 2,613,950 |
| මැයි | 3,405 | 3,915,750 |
| ජූනි | 1,465 | 1,684,750 |
| ජූලි | 1,802 | 2,072,300 |
| අගෝස්තු | 3,161 | 3,635,150 |
| සැප්තැම්බර් | 2,470 | 2,840,500 |
| ඔක්තෝබර් | 3,490 | 4,013,500 |
| නොවැම්බර් | 3,194 | 3,673,100 |
| දෙසැම්බර් | 3,505 | 4,030,750 |
| එකතුව | 28,967 | 33,312,050 |



(13) බැදුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම 2014 - 2021

| වර්ෂය | නිකුත් කළ ස්ටිකර් ප්‍රමාණය | ආදායම (ඒකක වටිනාකම රු:1000.00 / රු:1150.00) |
|---|---|---|
| 2014 | 46,194 | 46,194,000 |
| 2015 | 44,841 | 44,841,000 |
| 2016 | 35,573 | 35,573,000 |
| 2017 | 37,532 | 37,532,000 |
| 2018 | 38,173 | 38,173,000 |
| 2019 | 34,941 | 37,179,000 |
| 2020 | 24,881 | 28,613,150 |
| 2021 | 28,967 | 33,312,050 |
| එකතුව | 291,102 | 301,417,200 |




(14) විදේශගත වූ මඟීන්ගේ ආගමන විගමන තොරතුරු ඇතුළත් ලිපි විවිධ ආයතනවල අවශ්‍යතාවය අනුව නිකුත් කිරීම 2016 – 2021

| වර්ෂය | ලිපි සංඛ්‍යාව |
|---|---|
| 2016 | 6,483 |
| 2017 | 5,672 |
| 2018 | 4,884 |
| 2019 | 3,431 |
| 2020 | 723 |
| 2021 | 1,921 |

**(15) ශ්‍රී ලංකාවට විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) නොමැතිව පැමිණෙන සංචාරකයන් හට තොටුපළවලදී විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ලබා දීම.**

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපළ | 443,748 | 448,811 | 407,964 | 428,775 | 635,054 | 115,692 | 13,081 |

**2.1.2.3 විමර්ශන ශාඛාව**

(1) 2021වසරේදී සිදු කළ විමර්ශනයන්ට අනුව රටින් ඉවත් කළ විදේශිකයන් සංඛ්‍යාව.

| මාසය | විමර්ශනය කළ සංඛ්‍යාව | ඉවත් කළ සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 50 | 41 |
| පෙබරවාරි | 38 | 16 |
| මාර්තු | 191 | 11 |
| අප්‍රේල් | 19 | 6 |
| මැයි | 18 | 0 |
| ජූනි | 4 | 1 |
| ජූලි | 16 | 1 |
| අගෝස්තු | 2 | 1 |
| සැප්තැම්බර් | 12 | 17 |
| ඔක්තෝබර් | 16 | 1 |
| නොවැම්බර් | 45 | 21 |
| දෙසැම්බර් | 94 | 14 |
| එකතුව | 505 | 130 |

(2) රටින් ඉවත් කරන ලද විදේශිකයන් ජාතීන් අනුව ( 2021.01.01 සිට 2021.12.31 දක්වා)

| | ජාතිය | 2021 |
|---|---|---|
| 1 | ඉන්දියානු | 92 |
| 2 | නේපාල | 09 |
| 3 | නයිජීරියානු | 07 |
| 4 | පකිස්ථානු | 06 |
| 5 | රුසියානු | 05 |
| 6 | මාලදිවයින් | 02 |
| 7 | හොන්ඩුරාස් | 02 |
| 8 | චීන | 01 |
| 9 | යුක්රේන | 01 |
| 10 | කොරියානු | 01 |
| 11 | සුඩාන | 01 |
| 12 | බංගලාදේශ | 01 |
| 13 | දකුණු අප්‍රිකානු | 01 |
| 14 | උගන්ඩා | 01 |
| | එකතුව | 130 |

(3) විමර්ශන ඒකකය විසින් 2016-2021 දක්වා සිදුකළ විමර්ශන සංඛ්‍යාව

| මාසය | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 73 | 36 | 99 | 210 | 172 | 50 |
| පෙබරවාරි | 43 | 64 | 124 | 190 | 85 | 38 |
| මාර්තු | 50 | 89 | 166 | 337 | 49 | 191 |
| අප්‍රේල් | 72 | 48 | 126 | 209 | 3 | 19 |
| මැයි | 46 | 75 | 49 | 236 | 49 | 18 |
| ජූනි | 56 | 56 | 119 | 162 | 58 | 4 |
| ජූලි | 77 | 72 | 157 | 131 | 24 | 16 |
| අගෝස්තු | 89 | 112 | 72 | 90 | 47 | 2 |
| සැප්තැම්බර් | 109 | 88 | 113 | 140 | 39 | 12 |
| ඔක්තෝබර් | 57 | 29 | 233 | 63 | 10 | 16 |
| නොවැම්බර් | 61 | 82 | 316 | 116 | 2 | 45 |
| දෙසැම්බර් | 23 | 42 | 192 | 81 | 18 | 94 |
| එකතුව | 756 | 793 | 1766 | 1965 | 556 | 505 |




(4) 2018 සිට 2021 වර්ෂය දක්වා සිදු කළ විමර්ශනයන්ට අනුව රටින් ඉවත් කරන ලද විදේශිකයන් සංඛ්‍යාව

| වසර | රටින් ඉවත් කරන ලද සංඛ්‍යාව |
|---|---|
| 2018 | 678 |
| 2019 | 898 |
| 2020 | 249 |
| 2021 | 130 |
| එකතුව | 1955 |

**සරණාගත තත්ත්වය අපේක්ෂාවෙන් එක්සත් ජාතීන්ගේ සරණාගතයන් සඳහා වන මහකොමසාරිස් කාර්යාලයේ (UNHCR) ලියාපදිංචි වීම පිළිබඳ දත්ත.**

**(5) 2021.12.31 දින වන විට සරණාගත තත්ත්වය ඉල්ලුම්කර සිටින විදේශිකයන් සංඛ්‍යාව (Asylum Seekers)**

| | ජාතිකත්වය | පුද්ගලයන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ඇෆ්ගනිස්ථානු | 27 |
| 02 | බංගලාදේශය | 02 |
| 03 | ඉරාන | 02 |
| 04 | ඉන්දියානු | 02 |
| 05 | ඉරාක | 02 |
| 06 | මාලදිවයින් | 03 |
| 07 | නයිජීරියානු | 08 |
| 08 | පාකිස්ථානු | 149 |
| 09 | පලස්තීනු | 03 |
| 10 | සුඩාන | 05 |
| 11 | සිරියානු | 02 |
| 12 | යේමන | 03 |
| | එකතුව | 208 |



**(6) 2021.12.31 දින වන විට සරණාගතයන් පිළිබඳ කටයුතු කිරීමේ ඒකකයේ අධීක්ෂණය යටතේ සරණාගත තත්ත්වය ලබා ලංකාව තුළ රැඳී සිටින විදේශිකයන් සංඛ්‍යාව (Refugees)**

| | ජාතිකත්වය | පුද්ගලයන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ඇෆ්ගනිස්ථානු | 113 |
| 02 | බංගලාදේශ | 01 |
| 03 | එරිත්‍රියානු | 01 |
| 04 | ඉන්දියානු | 01 |
| 05 | ඉරාන | 24 |
| 06 | මාලදිවයින් | 02 |
| 07 | මියන්මාර් | 35 |
| 08 | පාකිස්ථානු | 709 |
| 09 | පලස්තීනු | 06 |
| 10 | සෝමාලියානු | 01 |
| 11 | සුඩාන | 04 |
| 12 | යේමානු | 15 |
| | එකතුව | 912 |



(7) අවදානම් තක්සේරු මධ්‍යස්ථානය (RISK ASSESSMENT CENTER) මගින් පසුගිය කාල සීමාව තුළ සිදුකළ තක්සේරු කිරීම් හා ඒ අනුව රටට ඇතුළුවීමට ඉඩ නොදුන් අවදානම් සහගත පුද්ගලයින් සංඛ්‍යාව

| රට | තක්සේරුකිරීම් සංඛ්‍යාව | අවදානම් සංඛ්‍යාව |
|---|---|---|
| පාකිස්ථානය | 3000 | 144 |
| ඇෆ්ගනිස්ථානය | 146 | 50 |
| නේපාලය | 70 | 27 |
| උස්බෙකිස්ථාන් | 32 | 01 |
| එකතුව | 3248 | 222 |

(8) 2021 වර්ෂයේ විදේශික රැඳවුම් මධ්‍යස්ථානයේ සාරාංශය (වැලිසර සහ මිරිහාන) (DETENTION CENTERS)

- ඇතුලත් කළ මුළු විදේශිකයින් සංඛ්‍යාව (ජාතිකත්වය අනුව)

| | ජාතිකත්වය | ඇතුලත් කළ රැඳවියන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | චීන | 04 |
| 02 | ඉන්දියන් | 27 |
| 03 | මොසැම්බික් | 01 |
| 04 | මාලදිවයින් | 03 |
| 05 | නේපාල් | 09 |
| 06 | නයිජීරියන් | 07 |
| 07 | පකිස්ථාන් | 02 |
| 08 | රුසියන් | 02 |
| 09 | යුක්රේන | 04 |
| 10 | සෝමාලියානු | 05 |
| 11 | සුඩාන් | 01 |
| 12 | තායිලන්ත | 02 |
| | එකතුව | 67 |

- ඉවත් කළ මුළු විදේශිකයින් සංඛ්‍යාව (ජාතිකත්වය අනුව)

| | ජාතිකත්වය | ඉවත් කළ රැඳවියන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | චීන | 01 |
| 02 | ඉන්දියන් | 25 |
| 03 | මොසැම්බික් | 01 |
| 04 | මාලදිවයින් | 04 |
| 05 | නේපාල් | 11 |
| 06 | නයිජීරියන් | 07 |
| 07 | පකිස්ථාන් | 05 |
| 08 | රුසියන් | 02 |
| 09 | යුක්රේන | 04 |
| 10 | දකුණු අප්‍රිකානු | 01 |
| 11 | සුඩාන් | 01 |
| 12 | යේමන් | 01 |
| | එකතුව | 63 |

## (9) දේශසීමා ආවේක්ෂණ ඒකකය (BSU) මගින් 2021 වසරේ සිදු කළ කටයුතු පිළිබඳ සාරාංශය

| අංකය | ආයතනය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ගුවන් තොටුපළ අපරාධ විමර්ශන අංශය වෙත භාර දීම | 46 |
| 02 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය වෙත දැනුම්දීම | 15 |
| 03 | ගුවන් තොටුපළ අපරාධ විමර්ශන අංශය වෙත යොමු කිරීම | 08 |
| 04 | විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කිරීම | 04 |
| 05 | රටට ඇතුල්වීම වළක්වමින් නැවත හරවා යැවීම | 01 |
| 06 | වලංගු වීසා බලපත්‍ර නොමැතිව විදේශගත වීම වැළැක්වීම | 02 |
| 07 | නවාතැනක් ලබා දීම සඳහා සංක්‍රමණිකයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයට භාරදීම | 01 |

## 2.1.3 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

### 2.1.3.1 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව

ලියාපදිංචිය පිළිබඳ තොරතුරු සනාථ කිරීමේ ලිපි නිකුත් කිරීම 2017 – 2021

| පනත | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| 1949 අංක 03 | 29 | 20 | 18 | 24 | 29 |
| 1967 අංක 14 | 30 | 10 | 13 | 16 | 25 |
| 1988 අංක 39 | 24 | 13 | 10 | 09 | 14 |
| 2003 අංක 35 | - | 01 | - | 01 | - |




### 2.1.3.2 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව

2021 වර්ෂයේ ක්‍රියාත්මකවූ මූලධන ව්‍යාපෘති වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘතිය | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 1 | 7 වන මහල ශ්‍රවණාගාරය වැඩිදියුණු කිරීම | 3.10 | 3.04 | 98 | 100% |
| 2 | වැලිසර පිහිටි වඩා පහසුකම් සහිත ස්ථානයකට විදේශීය රැඳවියන් සඳහා වන රැඳවුම් මධ්‍යස්ථානය රැගෙන යාම (අදියර 1) | 5.59 | 5.50 | 98 | 100% |
| 3 | නවරැඳවුම් මධ්‍යස්ථානයේ කාර්යාල කාමරය සහ ආරක්ෂක කුටිය ඉදිකිරීම (අදියර 2) | 2.46 | 2.42 | 98 | 100% |

| | ව්‍යාපෘතිය | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 4 | නවරුඳවුම් මධ්‍යස්ථානය ඉදිකිරීමට යෝජිත ඉඩම වටා වැටක් ඉදිකිරීම | 1.36 | 1.32 | 97 | 100% |
| 5 | වව්නියා විවේකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම | 0.46 | 0.42 | 91 | 100% |
| 6 | නියෝජ්‍ය පාලක (තොරතුරු තාක්ෂණ) සඳහා කාර්යාල පහසුකම් සැපයීම | 0.57 | 0.10 | 91 | 100% |
| 7 | රත්මලාන ගුවන් තොටුපළේ ආගමන විගමන කාර්යාල පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම | 1.40 | _ | _ | 70% |
| 8 | විමර්ශන ශාඛාවේ කාමර වෙන් කිරීම | 0.42 | 0.42 | 100 | 100% |
| 9 | 5 වන මහලේ නව්‍යකරණ කටයුතු | 0.18 | 0.17 | 94 | 100% |
| 10 | සංඛ්‍යාත්මක වාර්තා ජනනය කිරීමේ ඒකකය සඳහා කාර්යාල පහසුකම් ඇතිකිරීම | 0.24 | 0.22 | 91 | 100% |
| 11 | යන්ත්‍ර/යන්ත්‍රෝපකරණ අලුත් වැඩියාව සිදු කිරීම | 2.00 | 0.56 | 28 | 28% |
| 12 | වාහන අලුත්වැඩියාව | 4.00 | 3.95 | 99 | 100% |
| 13 | කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම | 6.00 | 3.57 | 60 | 60% |
| 14 | පරිගණක සහ උපාංග මිලදී ගැනීම | 7.90 | 4.57 | 58 | 58% |
| 15 | ගමන් බලපත්‍ර පරිලෝකන යන්ත්‍ර 65 ක් මිලට ගැනීම | 19.40 | 19.30 | 99 | 100% |
| 16 | මාර්ගගත අයදුම්පත් භාරගැනීමේ ක්‍රමවේදය සඳහා fiirwall මිලදී ගැනීම | 7.70 | 7.50 | 97 | 100% |
| 17 | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ නව පිටවීමේ පර්යන්තයේ නව්‍යකරණ කටයුතු | 9.00 | 7.50 | 83 | 100% |
| 18 | සංඛ්‍යාත්මක වාර්තා ජනනය කිරීම සඳහා මෘදුකාංග සංවර්ධනය කිරීම | 15.80 | 14.75 | 93 | 100% |
| 19 | විමර්ශන ඒකකයට අදාල මෘදුකාංග සංවර්ධනය කිරීම | 35.20 | 35.00 | 99 | 100% |
| 20 | මාර්ගගතක ක්‍රමවේදය ඔස්සේ ගමන්බලපත්‍ර අයදුම්පත් බාරගැනීමට මෘදුකාංග සංවර්ධනය කිරීම | 22.90 | 21.50 | 94 | 100% |
| 21 | පුරවැසිඅංශයට අදාල මෘදුකාංග සංවර්ධනය කිරීම | 29.60 | 29.50 | 99 | 100% |
| 22 | නියමිත දිනට වීසා කාලය ඉකුත් වී රැඳී සිටින විදේශිකයන් හඳුනාගැනීමට හැකි පරිසනක මෘදුකාංගයක් සංවර්ධනය කිරීම | 4.20 | 4.12 | 98 | 100% |
| 23 | නියමිත දිනට ප්‍රත්‍යන්ත ආවේක්ෂණ ඒකකයට (BSU) අදාල මෘදුකාංගය සංවර්ධනය කිරීම | 17.30 | 16.28 | 94 | 100% |
| 24 | කාර්ය මණ්ඩල පුහුණුව | 2.22 | 2.07 | 93 | 100% |
| 25 | හිස් ගමන්බලපත්‍ර මිලදී ගැනීම හා උපාංග මිලදී ගැනීම | 1,000 | 767.80 | 77 | 100% |
| 26 | on arrival visa stikers මිලදී ගැනීම | 11.50 | 11.48 | 99 | 100% |
| | - | 1,210.50 | 963.06 | 80% | 93% |

### 2.1.4 තොරතුරු තාක්ෂණ අංශය

(1) ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS) මඟින් ප්‍රතිචාර දැක්වූ විමසුම් පිළිබඳ තොරතුරු

| අංකය | ආයතනය | එකතුව |
|---|---|---|
| 01 | ජර්මන් තානාපති කාර්යාලය | 03 |
| 02 | නෙදර්ලන්ත තානාපති කාර්යාලය | 01 |
| 03 | ඇමෙරිකානු තානාපති කාර්යාලය | 12 |
| 04 | ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය | 06 |
| 05 | සංක්‍රමණ සඳහා වන ජාත්‍යන්තර සංවිධානය | 01 |
| 06 | එක්සත් රාජධානියේ මහ කොමසාරිස් කාර්යාලය | 106 |
| 07 | ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය | 68 |
| 08 | ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය බ්‍රිතාන්‍යය | 70 |
| 09 | නෝර්වේ තානාපති කාර්යාලය | 01 |
| | එකතුව | 268 |

(2) නැවත භාරගැනීමේ ගැටළු කළමනාකරණ පද්ධතිය (RCMS) හරහා දෙපාර්තමේන්තුව මඟින් තාවකාලිකව නිර්දේශ කර ඇති ගමන් ලියවිලි හා එමගින් ශ්‍රී ලාංකික තානාපති කාර්යාල මඟින් නිකුත් කර ඇති තාවකාලික ගමන් ලියවිලි පිළිබඳ තොරතුරු

| රට | ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් නිකුත් කරන ලද සංඛ්‍යාව - 2020.12.31 දිනට |
|---|---|
| ඕස්ට්‍රේලියාව | 88 |
| ඔස්ට්‍රියාව | 03 |
| බෙල්ජියම | 02 |
| කැනඩාව | 03 |
| චීනය | 16 |
| ඊජිප්තුව | 15 |
| ප්‍රංශය | 60 |
| ජර්මනිය | 215 |
| ඉන්දුනීසියාව | 04 |
| ඉතාලිය | 39 |
| කුවේට් | 2,146 |
| නේපාලය | 06 |
| නෙදර්ලන්තය | 08 |

| රට | ශ්‍රී ලංකා තානාපති කාර්යාලය |
|---|---|
| ඕමානය | 139 |
| පෝලන්තය | 03 |
| කටාර් | 131 |
| රුමේනියාව | 05 |
| රුසියානු සමූහාණ්ඩුව | 31 |
| ස්වීඩනය | 08 |
| ස්විස්ටර්ලන්තය | 298 |
| තායිලන්තය | 11 |
| තුර්කිය | 12 |
| එක්සත් රාජධානිය | 26 |
| ඇමරිකා එක්සත් ජනපදය | 02 |
| එකතුව | 3,271 |

### 2.1.5 පුරවැසි අංශය

#### (1) පුරවැසි පනත අනුව නිකුත් කරන ලද සහතිකපත් සංඛ්‍යාව-2021

| වගන්තිය | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | නිකුත් කළ සහතිකපත් සංඛ්‍යාව |
|---|---|---|
| 5(2) වගන්තිය | 7,278 | 16,602 |
| 8 වගන්තිය | 12 | 1 |
| 11 වගන්තිය | 146 | 42 |
| 12 වගන්තිය | 19 | 6 |
| 19(2)/ 19(3) වගන්තිය | 5,401 | 4,654 |
| 20 වගන්තිය | 134 | 196 |
| එකතුව | 12,990 | 21,501 |

❖ පෙර වර්ෂයන්හි ලද අයදුම්පත් සඳහා ද 2021 වර්ෂයේදී සහතිකපත් නිකුත් කර ඇත.

#### (2) ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම 2021

| විස්තරය | නිකුත් කළ සහතිකපත් සංඛ්‍යාව |
|---|---|
| පුරවැසි පනතේ 19(2) වගන්තිය යටතේ ශ්‍රී ලංකා පුරවැසිභාවය නැවත ලබා ගැනීම | 2,607 |
| පුරවැසි පනතේ 19(3) වගන්තිය යටතේ ශ්‍රී ලංකා පුරවැසිභාවය නැවත ලබා ගැනීම | 2,047 |
| එකතුව | 4,654 |

(3) ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා සිදුකළ ඉල්ලීම් - 2021.01.01 දින සිට 2021.12.31 දිනට

| රට | ද්විත්ව පුරවැසිභාවය සඳහා ඉල්ලීම් කළ ප්‍රමාණය |
|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | 795 |
| ඕස්ට්‍රේලියාව | 1,621 |
| එක්සත් රාජධානිය | 885 |
| ඉතාලිය | 288 |
| කැනඩාව | 371 |
| ස්විට්සර්ලන්තය | 100 |
| ස්වීඩනය | 10 |
| නවසීලන්තය | 63 |
| ප්‍රංශය | 127 |
| ඩෙන්මාර්කය | 7 |
| වෙනත් | 1,134 |
| එකතුව | 5,401 |



## 2.1.6 පාලන අංශය

### 2.1.6.1 පාලන ඒකකය

- **බඳවා ගැනීම්**

**බලයලත් නිලධාරීන් බඳවා ගැනීම**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා බලයලත් නිලධාරීන් විවෘත හා සීමිත පදනම මත බඳවා ගැනීමේ මූලික කටයුතු 2021 වර්ෂයේදී සිදු කළ අතර ඊට අදාළ විභාග කටයුතු 2022 වර්ෂයේ මුල් භාගයේදී පැවැත්වීමට අපේක්ෂිතය.

**මෙහෙයුම් සහකාර නිලධාරීන් බඳවා ගැනීම**

විභාග නිවේදන කෙටුම්පත සකස් කිරීමේදී බඳවා ගැනීම් පටිපාටියේ සිදු කළ යුතු සංශෝධන හඳුනාගත හැකිවිය. අදාළ සංශෝධන සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව විභාග කටයුතු සිදු කිරීම සඳහා විභාග නිවේදන කෙටුම්පත විභාග දෙපාර්තමේන්තුවේ එකඟත්වය සඳහා යවා ඇත.

**විවේකාගාර සහායක බඳවා ගැනීම**

බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව මගින් දැනට රජයේ ආයතනයන්හි ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවල සේවා අවශ්‍යතාවයන් සඳහා යොදවන බහුකාර්ය සංවර්ධන සහායකයින් මෙම තනතුරු සඳහා යෙදවිය හැකි අතර, ඒ සඳහා රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත තොරතුරු යොමු කර ඇත.

- **උසස් කිරීම්**

| තනතුර | සංඛ්‍යාව | උසස්වීම් ලද තනතුර |
|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තිය | 05 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තිය |
| ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තිය | 03 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තිය |
| බලයලත් නිලධාරි II පන්තිය | 12 | බලයලත් නිලධාරි I පන්තිය |
| කළමනාකරණ සේවා නිලධාරි III පන්තිය | 12 | කළමනාකරණ සේවා නිලධාරි II පන්තිය |
| කළමනාකරණ සේවා නිලධාරි II පන්තිය | 11 | කළමනාකරණ සේවා නිලධාරි I පන්තිය |
| කාර්යාල සේවක සේවය III පන්තිය | 09 | කාර්යාල සේවක සේවය II පන්තිය |
| කාර්යාල සේවක සේවය II පන්තිය | 09 | කාර්යාල සේවක සේවය I පන්තිය |
| කාර්යාල සේවක සේවය I පන්තිය | 07 | කාර්යාල සේවක සේවය විශේෂ ශ්‍රේණිය |

- **සේවය ස්ථිර කිරීම්**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| දෙපාර්තමේන්තුගත (සහකාර පාලක) | 03 |

- **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ**

  - ❖ සහකාර පාලක (දෙපාර්තමේන්තුගත) නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය 2020.12.15 දිනැති ලිපියෙන් ලැබී ඇත. 2021.12.24 දින විභාග නිවේදනය ගැසට් පත්‍රයේ පළ වී ඇත.
  - ❖ බලයලත් නිලධාරි II ශ්‍රේණියේ නිලධාරීන්ගේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම සඳහා 2021.01.01 දිනැති *ගැසට්* නිවේදනය මඟින් ප්‍රසිද්ධියට පත් කර තිබේ. අදාළ විභාගය කඩිනමින් පවත්වන ලෙස විභාග කොමසාරිස් ජනරාල් වෙතින් ඉල්ලීම් කර ඇත.
  - ❖ බලයලත් නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන්ගේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීම සඳහා අදාළ විභාග නිවේදන කෙටුම්පත සහ *ගැසට්* නිවේදනයේ කෙටුම්පත විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබේ.
  - ❖ කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ගේ දෙවන සහ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ 2021.11.30 දින පවත්වන ලදී.
  - ❖ ගමන් බලපත් සහායක I ශ්‍රේණියේ නිලධාරීන්ගේ තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ලබන වසරේ පැවැත්වීමට විභාග නිවේදනය විභාග කොමසාරිස් ජනරාල්ගේ එකඟතාවය ලබා ගැනීමට යොමු කර ඇත.

- **ස්ථාන මාරු**

| තනතුර | 2021 වර්ෂයේ ස්ථාන මාරු වී පැමිණි නිලධාරි සංඛ්‍යාව | 2021 වර්ෂයේ ස්ථාන මාරු වී ගිය නිලධාරි සංඛ්‍යාව |
|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | 14 | 16 |
| ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය | 04 | 04 |
| භාෂා පරිවර්තක සේවය | 02 | 02 |
| සංවර්ධන නිලධාරි | 03 | 02 |
| කළමනාකරණ සේවා නිලධාරි | 80 | 74 |
| ඒකාබද්ධ රියදුරු සේවය | 05 | 02 |
| කාර්යාල සේවක සේවය | 07 | 09 |

- **විනය කටයුතු**

  - ❖ ආරම්භ කර ඇති මූලික විමර්ශන සංඛ්‍යාව - 07
  - ❖ මූලික විමර්ශන අවසන් කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතින ගොනු සංඛ්‍යාව - 03

- **විශ්‍රාම ගැන්වීම්**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක (දෙපාර්තමේන්තුගත) | 01 |
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරි | 01 |
| බලයලත් නිලධාරි | 01 |
| කළමනාකරණ සේවා නිලධාරි | 10 |
| නියාමක | 01 |
| ඒකාබද්ධ රියදුරු සේවය | 03 |
| කාර්යාල සේවක සේවය | 05 |

- **විශේෂිත කාර්යයන්**

  ❖ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ හම්බන්තොට වරාය හා මත්තල අන්තර්ජාතික ගුවන්තොටුපළ කාර්යාලවල සේවයේ නියුතු නිලධාරීන් සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීමට ලුණුගම්වෙහෙර පහල මත්තල ඉඩමක් පවරා ගැනීමට කටයුතු ආරම්භ කිරීම.

### 2.1.6.2 ප්‍රසම්පාදන ශාඛාව

2021 වර්ෂය තුළ ප්‍රසම්පාදනය කරන ලද භාණ්ඩ හා සේවාවල වටිනාකම

| ප්‍රසම්පාදනය කරන ලද භාණ්ඩ හා සේවා | භාණ්ඩවල වටිනාකම (රු.) |
|---|---|
| ගොඩනැගිලි අලුත්වැඩියාව | 5,650,376.00 |
| ගොඩනැගිලි ඉදිකිරීම් | 7,501,445.00 |
| කාර්යාලයීය උපකරණ හා ගෘහ භාණ්ඩ | 3,569,717.50 |
| යන්ත්‍රෝපකරණ හා උපකරණ අලුත්වැඩියාව | 564,960.00 |
| යන්ත්‍රෝපකරණ හා උපකරණ මිලදී ගැනීම් | 31,369,016.72 |
| මෘදුකාංග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති | 121,150,375.00 |
| හිස් ගමන් බලපත් මිලදී ගැනීම සහ ඊට අදාළ වෙනත් දෑ මිලදී ගැනීම | 767,798,021.67 |
| පැමිණීමේදී භාවිතා වන වීසා ස්ටිකර් මුද්‍රණය | 11,483,791.20 |
| එකතුව | 949,087,703.09 |

### 2.1.6.3. සුභසාධන ඒකකය

| සිදු කරන ලද කාර්යය 2021 | වැය වූ මුදල(රු.) |
|---|---|
| සාමාජිකයින් වෙනුවෙන් ණය ලබාදීම. | 11,325,000 |
| අවමංගල්‍යාධාර ලබා දීම. | 3,640,000 |
| දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා එන්නත්කරණ වැඩසටහනට අවශ්‍ය සංග්‍රහ කටයුතු සිදු කිරීම. | 300,000 |

## 2.2 මෙහෙයුම් කාර්යයන් මගින් ආදායම් උපයා ගැනීමේ ප්‍රගතිය

### 2.2.1 මෙහෙයුම් කාර්යයන් මගින් ආදායම් උපයාගැනීමේ ප්‍රගතිය 2021

| වියදම් මාසය | ආදායම (රුපියල්) | | | | | | මුළු ආදායම රු. |
|---|---|---|---|---|---|---|---|
| | ගමන් බලපත් නිකුත් කිරීම් හා සංශෝධන | විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත් කටයුතු | තොටුපළ කටයුතු | වීසා නිකුත් කිරීම් / දීර්ඝ කිරීම් | විද්‍යුත් සංචරණ අනුමැතිය(ETA) | පුරවැසි අංශය | |
| ජනවාරි | 110,603,500 | 151,965,173 | 1,377,700 | 64,088,203 | 7,224,535 | 51,821,900 | 387,081,011 |
| පෙබරවාරි | 133,601,500 | 144,220,374 | 1,959,600 | 64,157,422 | 24,665,453 | 43,680,020 | 412,284,369 |
| මාර්තු | 169,279,000 | 267,911,540 | 2,367,850 | 98,858,345 | 40,465,265 | 80,061,880 | 658,943,881 |
| අප්‍රේල් | 105,536,000 | 190,533,499 | 2,695,600 | 70,840,590 | 30,316,400 | 66,734,980 | 466,657,069 |
| මැයි | 52,234,000 | 157,039,934 | 3,530,500 | 43,907,959 | 20,927,362 | 27,343,980 | 304,983,735 |
| ජූනි | 79,103,500 | 210,715,400 | 1,958,450 | 36,292,037 | 9,964,865 | 19,924,075 | 357,958,327 |
| ජූලි | 201,757,500 | 195,774,675 | 2,689,850 | 68,462,965 | 14,997,086 | 82,370,042 | 566,052,118 |
| අගෝස්තු | 167,703,000 | 203,479,582 | 4,228,550 | 41,016,158 | 32,848,743 | 53,538,047 | 502,814,080 |
| සැප්තැම්බර් | 258,928,000 | 180,536,999 | 2,987,700 | 108,898,130 | 84,764,501 | 60,808,647 | 696,923,977 |
| ඔක්තෝබර් | 579,629,500 | 191,311,569 | 4,635,650 | 152,225,059 | 144,145,587 | 101,921,667 | 1,173,869,032 |
| නොවැම්බර් | 602,677,938 | 156,187,496 | 4,172,200 | 223,026,323 | 263,608,565 | 83,135,658 | 1,332,808,179 |
| දෙසැම්බර් | 541,048,000 | 266,305,899 | 4,490,750 | 266,006,938 | 664,975,794 | 60,912,800 | 1,803,740,181 |
| එකතුව | 3,002,101,438 | 2,315,982,139 | 37,094,400 | 1,237,780,131 | 673,928,361 | 732,253,697 | 8,664,115,960 |



### 2.2.2 මෙහෙයුම් කාර්යයන් මගින් ආදායම් උපයාගැනීමේ ප්‍රගතිය 2015 – 2021

| වර්ෂය | ආදායම (රුපියල් මිලියන) | | | | | | මුළු ආදායම රු.මි. |
|---|---|---|---|---|---|---|---|
| | ගමන් බලපත් නිකුත් කිරීම හා සංශෝධන | විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත් කටයුතු | තොටුපළ කටයුතු | වීසා නිකුත් කිරීම / දීර්ඝ කිරීම් | විද්‍යුත් සංචරණ අනුමැතිය | පුරවැසි අංශය | |
| 2015 | 2,105 | 1,028 | 74 | 917 | 5,134 | 850 | 10,108 |
| 2016 | 2,603 | 1,236 | 66 | 1,041 | 7,810 | 2,874 | 15,629 |
| 2017 | 2,639 | 1,331 | 68 | 1,145 | 8,465 | 1,650 | 15,299 |
| 2018 | 2,828 | 1,374 | 64 | 1,240 | 10,143 | 1,611 | 17,260 |
| 2019 | 3,810 | 1,695 | 58 | 1,170 | 5,860 | 1,462 | 14,054 |
| 2020 | 1,138 | 1,588 | 31 | 823 | 901 | 1,052 | 5,533 |
| 2021 | 3,002 | 2,316 | 37 | 1,238 | 1,339 | 732 | 8,664 |

## 2.3 විශේෂ ජයග්‍රහණ

1. 2019-2021 වර්ෂ සඳහා වූ ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලියට අදාලව අන්තර් දෙපාර්තමේන්තු අංශයෙන් සමස්ත දිවයිනෙන් ම දෙවන ස්ථානය හිමි කර ගැනීම.

2. ආගාමික හා විගාමික පනතෙහි 14 වන වගන්තිය සංශෝධනය කිරීම යටතේ වීසා කාල සීමාවන් දීර්ඝ කිරීමට කටයුතු කිරීම තුළින්, ආයෝජකයින්ට හා විදේශ ශිෂ්‍යයන්ගේ අධ්‍යයන සඳහා හිතකර වීසා ක්‍රමවේදයන් හඳුන්වා දෙනු ලැබීය. මෙමඟින් රටේ ආර්ථික වර්ධනය කෙරෙහි යහපත් දායකත්වයක් ඇතිවනවා මෙන්ම වෙනත් රටක පුරවැසිභාවය ලබාගත් ශ්‍රීලාංකිකයන් සඳහා ස්ථිර වාස වීසා ක්‍රමවේදයක් හඳුන්වා දීම තුළින් ඔවුන්ගේ දැනුම හා ආර්ථික ශක්තීන් රට තුලට ගලා ඒමට අවස්ථාව සලසා දීම.

3. මෙම වසරේදී වීසා ගාස්තු සම්බන්ධයෙන් වූ ආගාමික හා විගාමික රෙගුලාසි සංශෝධනය කිරීම තුලින් වීසා ආදායම වර්ධනය කිරීමට හැකි වූ අතර වීසා ගාස්තු ඩොලර්වලින් අයකිරීමට අවස්ථාව සලසනු ලැබීය.

4. සේවාලාභීන්ට වඩාත් ගුණාත්මක සේවයක් ලබා දීම සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම.

5. ගෝලීය වසංගත තත්ත්වයන් හමුවේ වුව ද අඛණ්ඩ සේවයක් සේවාලාභීන් වෙත ලබා දෙමින් අපේක්ෂිත ඉලක්කයන් අභිබවා රුපියල් බිලියන 8.66 ක දායකත්වයකින් ජාතික ආදායම පෝෂණය කිරීමට හැකි වීම.

6. ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි විදේශිකයන් රට තුලට ඇතුළුවීම වලක්වාලීමට හා ආගමික හා විගාමික පනත උල්ලංඝනය කරනු ලබන විදේශිකයන් හඳුනා ගැනීම සඳහා විමර්ශන අංශය විසින් සිදු කරන කාර්යයන්ට අවශ්‍ය සහය සැපයීමට නව මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය කිරීම

7. එසේම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ස්ථාපිත ප්‍රත්‍යන්ත ආවේක්ෂණ ඒකකයට (BSU) අදාල මෘදුකාංග සංවර්ධනය කිරීම තුළින් ද වඩා කාර්යක්ෂම හා විධිමත් ලෙස විමර්ශන කාර්යයන් ඉටු කිරීමට හැකි වීම.

8. නව ගමන් බලපත්‍ර පරිලෝකන යන්ත්‍ර 65 ක් තොටුපෙළවල ස්ථාපනය කිරීම තුලින් කාර්යක්ෂම මඟී නිෂ්කාශන සේවාවක් ඉටු කිරීමට හැකි වීම.

## 2.4 අභියෝග

1. ගෝලීය කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ, විශේෂයෙන් විදේශ වල සිට පැමිණෙන්නන් ඇතුලු අනෙකුත් ජනතාවට නිරන්තරයෙන් සේවය සැපයීමට සිදුවන ආයතනයක් ලෙස නිලධාරීන්ගේ සෞඛ්‍යය ආරක්ෂාව පිළිබඳව මෙන්ම, අඛණ්ඩව සේවාවන් පවත්වාගෙන යාම කෙරෙහි ද දැඩි අවධානයක් යොමු කිරීමට සිදු වීම.

2. ජාතික අයවැය චක්‍රලේඛයන් ප්‍රකාරව නව ගොඩනැගිලි ඉදිකිරීම තාවකාලිකව අත්හිටුවීමට රජය විසින් ගෙන ඇති තීරණය පරිදි ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරනු ලබන විදේශිකයන් රඳවා තබා ගැනීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට අපහසු වීම.

3. තාක්ෂණය මත පදනම්ව සේවා සපයන ආයතනයක් ලෙස පද්ධති බිඳ වැටීම් වලින් තොරව පවත්වා ගෙන යාම සඳහා නිරන්තර අවධානයෙන් පසුවීම හා යාවත්කාලීන කටයුතු අඛණ්ඩව සිදු කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන සපයා ගැනීමට අපහසු වීම.

දෙපාර්තමේන්තුවේ පවතින ඒකාබද්ධ සේවයේ පුරප්පාඩු (කළමනාකරණ සේවා නිලධාරි / කාර්යාල සේවක සේවය / රියදුරු වැනි තනතුරුවල) වාර්ෂික ස්ථානමාරු මගින් පුරවා ගැනීමට අපේක්ෂිතය. දෙපාර්තමේන්තුගත තනතුරුවල ප්‍රමුඛතම පුරප්පාඩුවක් ලෙස දැකිය හැක්කේ 2019 වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලයට එක් කර ඇති මෙහෙයුම් සහකාර තනතුරු 100 සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු නොවීමය. ගුවන් තොටුපළ ආගමන හා විගමන කටයුතුවලදී අදාළ මෙහෙයුම් කාර්යය වඩාත් කාර්යක්ෂමව සිදු කිරීම සඳහා මෙම මෙහෙයුම් සහකාර තනතුර ඇතුළත් කර ඇති අතර, ඒ සඳහා 100ක සේවක සංඛ්‍යාවක් බඳවාගැනීමට අනුමැතිය ලබාගෙන ඇත. එම තනතුරට අදාළ බඳවාගැනීම් පටිපාටියේ සංශෝධන සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව මෙහෙයුම් සහකාර බඳවාගැනීම් කටයුතු 2022 වර්ෂයේ මුල් කාර්තුව තුළ සිදු කිරීමට අපේක්ෂිතය. 2019 වර්ෂයේ විවේකාගාර සහායක තනතුරු 06 අනුමත වී ඇත. ඒ අනුව බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව මගින් දැනට රජයේ ආයතනයන්හි ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවල සේවා අවශ්‍යතාවයන් සඳහා යොදවන බහුකාර්ය සංවර්ධන සහායකයින් යොදවා විවේකාගාර සහායක තනතුරුවල පුරප්පාඩු පිරවීමට අපේක්ෂිතය. ඒ සඳහා රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය ආමාත්‍යාංශ ලේකම් වෙත තොරතුරු යොමු කර ඇත. බලයලත් නිලධාරි තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වන විභාග පැවැත්වීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කාලසටහන අනුව දින වෙන් කර තිබුණ ද කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නියමිත දිනයන්හි විභාග පැවැත්වීමට නොහැකි විය. ඒ අනුව 2022 වර්ෂය තුළ විභාග දෙපාර්තමේන්තුව විසින් අදාළ විභාග කඩිනමින් පැවැත්වුවහොත් පුරප්පාඩු 2022 වසරේ යථාවත් කිරීමට හැකිවනු ඇත. ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහකාර පාලක (දෙපාර්තමේන්තුගත) තනතුරුවල දැනට පවතින පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට තොරතුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර අනුමැතිය ලැබීමෙන් පසු තනතුරු සඳහා බඳවාගැනීමට කටයුතු කරනු ලැබේ.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරනලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථආයෝජන (රු.000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| භාණ්ඩ සමීක්ෂණ කමිටු කාර්යයභාර්ය පිළිබඳ දැනුවත් කිරීම | භාණ්ඩ සමීක්ෂණය සඳහා නම් කළ නිලධාරීන් | දින 01 | 4.85 | | දේශීය | භාණ්ඩ සමීක්ෂණයට අදාළ වැඩ පියවරවල් පිළිබඳ අවබෝධය පුළුල් වීම. |
| අවිධිමත් සංක්‍රමණ සහ මිනිස් ජාවාරම පිළිබඳ කෙටි පාඨමාලාව | බලයලත් නිලධාරීන් 35 | පැය 50 | | | දේශීය | ජාත්‍යන්තර මිනිස් වෙළෙදාම පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර නීති පද්ධතිය හා ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම වර්ධනය වීම. |
| දෙමළ භාෂා පාඨමාලාව | කළමනාකරණ සේවා නිලධාරීන් 45 | පැය 150 | 450 | | දේශීය | රාජ්‍ය සේවා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව නිලධාරී භාෂා කුසලතාව ඉහළ නැංවීම. |
| සංක්‍රමණ කළමනාකරණයේ ධාරිතාව ශක්තිමත් කිරීම පිළිබඳ වැඩමුළුව | විධායක නිලධාරීන් 20 | දින 2 | | | දේශීය | ප්‍රත්‍යන්ත පාලන කටයුතු හා සමාන්තර සේවා ආයතනවල සේවාවන් පිළිබඳ අවබෝධය පුළුල් වීම. |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | විධායක නිලධාරීන් 25 | දින 10 | 500 | | දේශීය | විෂය ක්‍රියාත්මක කිරීමට අදාලව අනුගමනය කලයුතු නිවැරදි පියවරයන් භාවිතයට පෙළඹීම. |
| වෘත්තිය පුහුණුව පිළිබඳ පශ්චාත් උපාධි ඉංග්‍රීසි ඩිප්ලෝමාව | විධායක නිලධාරීන් 01 | අවුරුදු 01 | 98 | | දේශීය | විධායක නිලධාරියෙකු ලෙස ඉංග්‍රීසි භාෂාව ආශ්‍රයෙන් සුදුසු පරිදි රාජකාරි කිරීමට හැකිවීම හා රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡාවන්හිදී වෘත්තිය මට්ටමින් පෙනී සිටීමට උනන්දුවීම. |

| වැඩසටහනේ නම | පුහුණු කරනලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථආයෝජන (රු.000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| වීසා ක්‍රමවේදයේ නව වෙනස්වීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන | බලයලත් නිලධාරීන් 12 | පැය 04 | 0.98 | | දේශීය | විෂය භාවිත කරන්නන් ලෙස නව තත්ත්වයන් හඳුනාගනිමින් රාජකාරියට ආදේශ කර ගැනීම |
| කැළණිය විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද සමාජ විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලාව (2020/2021) | විධායක නිලධාරීන් 01 | අවුරුදු 02 | 80 | | දේශීය | සේවා අවශ්‍යතාවය සපුරාගනිමින් නව දැනුම රාජකාරිය කාර්යක්ෂමව සිදුකිරීමට යොදා ගැනීම |
| නායකත්ව පුහුණු වැඩසටහන (මාර්ගගත) | බලයලත් නිලධාරීන් 15 | දින 02 | 2.04 | | දේශීය | තීරණ ගැනීම හා පෞරුෂත්වය වර්ධනය වීම |
| සේවක අනුස්ථාපන වැඩසටහන | ස්ථාන මාරුවීම් ලබා පැමිණි නවක නිලධාරීන් 70 | දින 10 | 48.13 | | දේශීය | දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යයභාරය සරලව හඳුනාගනිමින්, විවිධ ආයතන වලින් අනුයුක්ත වන නිලධාරීන් දෙපාර්තමේන්තුවේ උප සංස්කෘතිය හඳුනා ගැනීම |
| රාජ්‍ය නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ වැඩමුළුව | කළමනාකරණ සේවා නිලධාරීන් 15 | පැය 06 | 3.95 | | දේශීය | විෂය කරුණු අවබෝධ කරගනිමින් රාජකාරිය ඉටුකිරීම පහසුවීම |
| ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව - පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලය | බලයලත් නිලධාරී 03 | අවුරුදු 01 | 48.75 | | දේශීය | ජාත්‍යන්තර මඟී නිෂ්කාශන කටයුතුවලදී භාෂාමය ප්‍රවීණතාවය උසස් මට්ටමකට ගෙන ඒම |

| වැඩසටහනේ නම | පුහුණු කරනලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථආයෝජන (රු.000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| දෙමළ භාෂා පාඨමාලාව පැය 200 | බලයලත් නිලධාරී 76 | පැය 200 | 150 | | දේශීය | ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට දායකවීම හා සේවා අවශ්‍යතාවය සපුරාලීම |
| ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳ පුහුණුව - UNCHR | බලයලත් නිලධාරී 20 | දින 02 | | | දේශීය | ජාත්‍යන්තර සංක්‍රමණයේදී අවිධිමත් සේවා නීති විරෝධීව රටට ඇතුළුවන හා රැඳී සිටින පුද්ගලයන් අත්අඩංගුවට ගෙන රඳවා තබාගැනීමේදී ජාත්‍යන්තර පිරිවිතරයන් හඳුනා ගැනීම |
| කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපළ නිරීක්ෂණ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | කළමනාකරණ සේවා නිලධාරී 90 | දින 02 | 84.28 | | දේශීය | ගුවන්තොටුපළ හරහා වන මඟී නිශ්කාෂණ (රටට ඇතුළුවීමේදී හා පිටවීමේදී) ක්‍රියාවලිය අවබෝධ කර ගැනීම ආශ්‍රිත සේවාවන් හඳුනා ගැනීම |
| මත්තල ගුවන් තොටුපල නිරීක්ෂණ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | ගමන්බලපත් සහයක හා කළමනාකරණ සේවා නිලධාරී 27 | දින 01 | 27.84 | | දේශීය | ගුවන්තොටුපළ හරහා වන මඟී නිශ්කාෂණ (රටට ඇතුළුවීමේදී හා පිටවීමේදී) ක්‍රියාවලිය අවබෝධ කර ගැනීම ආශ්‍රිත සේවාවන් හඳුනා ගැනීම |
| මිනිස් ජාවාරම් සහ මිනිස් ජාවාරම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අක්‍රමවත් සංක්‍රමණය පිළිබඳ කෙටි පාඨමාලාව - OUSL (2021/2022) | බලයලත් නිලධාරී 41 | මාස 05 | 420 | | දේශීය | ජාත්‍යන්තර මිනිස් වෙළඳාම පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර නීති පද්ධතිය හා ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම වර්ධනය වීම |

| වැඩසටහනේ නම | පුහුණු කරනලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථආයෝජන (රු.000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ඉංග්‍රීසි පාඨමාලාව - කොළඹ විශ්ව විද්‍යාලය | බලයලත් නිලධාරී 01 | වසර 01 | | | දේශීය | ජාත්‍යන්තර මගී නිෂ්කාශන කටයුතුවලදී භාෂාමය ප්‍රවීණතාවය උසස් මට්ටමකට ගෙනඒම |
| මිනිස් ජාවාරම් සහ මිනිස් ජාවාරම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අක්‍රමවත් සංක්‍රමණය පිළිබඳ කෙටි පාඨමාලාව - OUSL (2021/2022) | බලයලත් නිලධාරී 35 | දින 02 | | | දේශීය | ජාත්‍යන්තර මිනිස් වෙළෙඳාම පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර නීති පද්ධතිය හා ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම වර්ධනය වීම |
| ඉංග්‍රීසි භාෂා පුහුණුව ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය (කණ්ඩායම් 03) | බලයලත් නිලධාරී - 43 | පැය 50 | | | දේශීය | ඉංග්‍රීසි භාෂාව පරිශීලනය කිරීමේ කුසලතාවය (ලිඛිත හා වාචික) වර්ධනය වීම |
| ලේඛන පරීක්ෂණ සහ මුහුණ හඳුනාගැනීම පිළිබඳ පුහුණුව - ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය | බලයලත් නිලධාරී 32 | දින 03 | | | දේශීය | විදේශ ගමන් බලපත්‍ර (වීසා පත්‍ර) ඇතුළුවීම සඳහා භාවිතා කරනු ලබන සහායක ලියකියවිලි වල නිර්ව්‍යාජත්වය තහවුරු කරගැනීමේ කුසලතාවය ඉහළ නැංවීම |
| අපරාධ නීතියට අනුකූලව මිනිස් ජාවාරම් සහ හොර රහසේ සංක්‍රමණිකයන් සහ වැරදිකරුවන් හඳුනාගැනීම | බලයලත් නිලධාරී 36 | දින 01 | | | දේශීය | අපරාධ නීතිය මූලික කොට ගනිමින් මිනිස් ජාවාරමේ යෙදෙන්නන් හඳුනා ගැනීම හා ඒ සඳහා ගතයුතු නීතිමය ක්‍රියා මාර්ගයන් පිළිබඳ අවබෝධය වැඩිවීම |

| වැඩසටහනේ නම | පුහුණු කරනලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථආයෝජන (රු.000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| කාර්යය සාධන දර්ශක (KPI) පිළිබඳ සමාලෝචන වැඩමුළුව | දෙපාර්තමේන්තු නිලධාරීන් - 55 | දින 01 | 288.4 | | දේශීය | ආයතනික අරමුණු නිවැරදිව හඳුනාගනිමින් ඒවා ලබා කර ගැනීමට වැඩසටහන් සකස් කිරීම හා අරමුණු ලබා කර ගැනීම නිවැරදිව මැනීමේ නිර්ණායකයන් සකස් කර ගැනීම |
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් පැවති රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | දෙපාර්තමේන්තු නිලධාරීන් - 06 | දින 01 | 24 | | දේශීය | රාජ්‍ය නිලධාරීන්ගේ මාසික/ වාර්ෂික වැටුප් ගණනයන් නිවැරදිව හා කාර්යක්ෂමව කිරීමට අවශ්‍ය දැනුම වැඩිදියුණු කිරීම |

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

- ආයතනය විසින් අත්පත් කරගත් ජයග්‍රහණයන් සඳහා සහ සාර්ථක කාර්යසාධන මට්ටමක් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු හා සංවර්ධන ක්‍රියාවලිය බොහෝ සෙයින් ඉවහල් වී තිබේ.

- දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු පදනමින් හෝ බඳවා ගැනීමේ පදනමින් එක්වන නව කාර්ය මණ්ඩල සාමාජිකයන්ට දෙපාර්තමේන්තු කාර්යයන් පිළිබඳව ලබා දෙන විධිමත් පුහුණුවෙන් පසු නිලධාරියා දෙපාර්තමේන්තුවේ සේවය කරන කාලය තුළම ඔවුන්ට අවශ්‍ය වන දැනුම යාවත්කාලීන කිරීම සඳහා අඛණ්ඩ පුහුණු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වේ.

- අවශ්‍යතා අනුව යාවත්කාලීන වන විධිමත් පුහුණු සැලැස්මකට අනුව ක්‍රියාත්මක මෙම වැඩ පිළිවෙල මගින් නව ගෝලීය ප්‍රවනතා සමඟ එයට අනුගත වෙමින් ඉදිරියට යන දෙපාර්තමේන්තුවක් ලෙස එහි නිලධාරීන් දැනුමෙන් පෝෂිත කිරීම කෙරෙහි නිරන්තර අවධානයෙන් කටයුතු කරනු ලැබේ.

- පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා වර්ෂයකට වෙන්වන ප්‍රතිපාදනයන්ට අමතරව ජාත්‍යන්තර සංවිධාන, තානාපති කාර්යාල වැනි බාහිර ආයතනයන්ගේ අනුග්‍රහය යටතේ ද, විදේශීය පුහුණු අවස්ථාවන්

හඳුනා ගනිමින් ඒ සඳහා නිලධාරීන්ට අවස්ථාව සලසාලමින් ද නිලධාරීන්ගේ දැනුම,ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීමට නිරන්තරව කටයුතු කරනු ලබයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස දෙපාර්තමේන්තුවට ආර්ථික කාර්ය සාධනයක් අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකියාව ලැබී තිබේ.

2021 වසර තුල ක්‍රියාත්මක කළ පුහුණු සංවර්ධන වැඩසටහන් ඉහත වගුව මඟින් සම්පිණ්ඩනය කොට දක්වා ඇත.





## 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.6 | වෙනත් | - | - | - |
| 2 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445) | | - | - |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | භානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 3 | මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභි නියෝජනය කිරීම (මු.රෙ. 135) | | - | - |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතාකිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| 4 | වාර්ෂික සැලසුම් සකස් කිරීම | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 5 | විගණන විමසුම් | | - | - |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| 6 | අභ්‍යන්තර විගණනය | | - | - |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල නොවේ | විගණන වාර්ථා සඳහා පැහැදිලි කිරීම් ප්‍රමාද වීම. | විගණන හා කළමනාකරණ කමිටුවේදී දැනුම් දීම. |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තෙමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 7 | විගණන හා කළමනාකරණ කමිටු | | - | - |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි | - |
| 8 | වත්කම් කළමනාකරණය | | - | - |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තාකර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | - | - |
| 9 | වාහන කළමනාකරණය | | - | - |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූලවේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 10 | බැංකු ගිණුම් කළමනාකරණය | | - | - |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ සක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | - | - |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල නොවේ | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් ඇතැම් වැය විෂයන් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. | අතිරේක යම් ප්‍රතිපාදනයක් අවශ්‍ය නම් එය වර්ෂය තුළ ලබා ගැනීම හා බිල්පත් වර්ෂය තුළ ඉදිරිපත් කිරීමට අදාල අංශ දැනුවත් කිරීම. |
| 12 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම. | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | වැඩ තහනමට ලක් වූ නිලධාරීන් තිදෙනෙකු සිටීම සහ විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ පුද්ගලික ලිපිගොණු සකස්කර අවසන් නොවීම. | අය කර ගැනීමට කටයුතු කිරීම. |
| 13 | පොදු තැන්පත් ගිණුම | | - | - |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 14 | අග්‍රිම ගිණුම | | - | - |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | - | - |
| 15 | ආදායම් ගිණුම | | - | - |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 16 | මානව සම්පත් කළමනාකරණය | | - | - |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 17 | මහජනයා වෙත තොරතුරු ලබා දීම | | - | - |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා ඇත | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 8 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 18 | පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම. | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19 | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘති පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර තිබීම. | අනුකූල වේ | | |
| 20 | විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම | | - | - |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | - | - |

ඇමුණුම 01

විගණකාධිපතිවරයාගේ වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } ජේඑල්ඔ/බී/ඩීයිබී/එෆ්එස්/2021/07 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 මැයි 31 දින

පාලක ජනරාල්,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටුව 1 | 13

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

පිටුව 2 | 13

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

පිටුව 3 | 13

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

##### 1.6.1.1 ආදායම් ලැබීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් එකතු කරන ලද ආදායම දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව රු.50,283,070ක් වුවද ආදායම් ප්‍රකාශයේ සහ සැසඳුම් ප්‍රකාශයේ එම අගය රු.50,287,875ක් ලෙස රු.4,805ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම (2004 -01-00) ආදායම රු.31,965,517ක් වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු.31,960,711ක් වූ බැවින් වෙනස රු.4,806ක් විය.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ආදායම් සාරාංශ වාර්තාව අනුව ආදායම හා භාණ්ඩාගාර මාසික ආදායම් වාර්තා අනුව ආදායම අතර මාස 7කදී එකතුව රු.13,691ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වීසා බලපත්‍ර, විදේශ ගමන් බලපත්‍ර හා ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සම්බන්ධ ගාස්තු ආදායම හෙවත් බදු නොවන ආදායමෙන්

(2003.02.07) ජනවාරි මාසයේදී ආපසු ගෙවන ලද රු.287,500ක මුදල අනෙකුත් ලැබීම ආපසු ගෙවීම (2003.99.00) ලෙස සටහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ බදු නොවන ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි.

### 1.6.2 අක්මුදල් ගැලපුම් ගිණුම

දෙපාර්තමේන්තුව විසින් වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් කරන ලද වියදම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සහ අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයේ රු.3,135,732ක් ලෙස සටහන් කර තිබුණු නමුත් ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු.2,799,376ක් විය.

### 1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

#### 1.6.3.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ වටිනාකම රු.404,759,071ක් වුවද 2021 ජනවාරි 01 දිනට එම ශේෂය රු.405,030,372ක් ලෙස රු.271,301ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල තිබූ රු.47,305,154ක නොනිමි වැඩ (ගොඩනැගිලි) ශේෂය 2021 ආරම්භක ශේෂය ලෙස මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්රකාශයේ (ACA 6) ඇතුලත් නොකර 2021 වර්ෂයේ ගොඩනැගිලි මිලදී ගැනීම් තීරුවට ඇතුලත් කර තිබුණි.

### 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

#### 1.6.4.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 වර්ෂයේ දී වාහන දෙකක් විකිණීමෙන් ලද රු.3,111,110ක මුදල ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ ඇතුලත් නොකර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ආදායම් නොවන ලැබීම් ලෙස දක්වා තිබුණි.

පිටුව 5 | 13

(ආ) වියදම් ප්‍රකාශයේ (ACA – 2 (ii) ) මුදල් පොතට අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වටිනාකම රු.1,336,442,528ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එම අගය රු.1,336,104,173ක් වූ බැවින් රු.338,355ක වෙනසක් නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අග්‍රිම ගිණුම අනුව වියදම් මඟින් අග්‍රිම පියවීමේ වටිනාකම රු.2,113,835,822ක් වුවද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව (SA 21) වටිනාකම රු.2,490,631,457ක් වූ බැවින් අග්‍රිම ගිණුමේ රු.376,795,635ක් අඩුවෙන් සටහන් වී තිබුණි.

2.2 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 85 (2) (ආ) ප්‍රකාරව පසුව ඇස්තමේන්තු වෙනස් කිරීමට අවශ්‍ය බව පෙනෙයි නම් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් ඊට හේතු සහිතව ඒ බව ආර්ථික කටයුතු සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කල යුතු වුවද 2021 වර්ෂයේ දී ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කර ඇති නමුත්, එසේ වෙනස් කිරීමට අවශ්‍ය හේතු සහිත වාර්තාව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කර නොතිබුණි.

(ආ) 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015, 07 ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් තම ත්‍රෛමාසික ආදායම් වාර්තා එම කාලසීමාව අවසන් වූ දින සිට දින 15ක් ඇතුලත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වුවද ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

පිටුව 6 | 13

**2.3 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට වෙන්කල පුනරාවර්තන වැය විෂයයන් 05ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 02ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය.

(ආ) ඇස්තමේන්තු සකස් කිරීමේ දී පසුගිය වර්ෂවල වියදම් සම්බන්ධයෙන් විධිමත් අවධානයක් යොමු කර නොතිබුණු බැවින් වෙනත් වියදම් සඳහා 2019 හා 2020 වර්ෂවල වියදම් පිළිවෙලින් රු.මිලියන 124.78ක් හා රු.මිලියන 93.57ක් ව තිබියදී 2021 වර්ෂයේදී රු.මිලියන 223.8ක් වෙන්කර තිබුණි. මෙම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 7.9ක් මුදල් රෙගුලාසි 66 මගින් මාරු කල පසුවද රු.මිලියන 120.33ක් හෙවත් සියයට 56ක් ඉතිරිවී තිබුණි.

(ඇ) 2021 වර්ෂයේ දී යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම වෙනුවෙන් වෙන්කල ප්‍රතිපාදනයෙන් සියයට 72ක්ම උපයෝජනය කර නොතිබුණි.

(ඈ) 2021 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ මූලධන වැය විෂයන් 4ක් වෙනුවෙන් වෙන්කල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 74 සිට සියයට 99ක් දක්වා 2021 දෙසැම්බර් මාසයේදී වියදම් කර තිබුණි.

**2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් නොවූ එකතුව රු.19,034,888ක බැරකම 2022 වර්ෂයේදී වවුචර් මගින් නිරවුල් කර තිබුණි.

(ආ) වැය විෂයයන් 06ක ඉතිරිය ඉක්මවා රු.10,403,168ක බැරකම්වලට එළඹී තිබුණි.

(ඇ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3 ඡේදය සහ 2021 ඔක්තෝම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/02 හි 4.5 ඡේදය ප්‍රකාරව බැඳීම් හා බැරකම් සිගාස් වෙබ් යෙදුම වෙත උඩුගත කල යුතු අතර, එලෙස වාර්තා නොකරන ලද කිසිදු බැඳීමක් හෝ බැරකමක් 2022 වර්ෂය තුල නිරවුල් නොකළ

යුතු බවත් සඳහන් වුවද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බැදීම් හා බැරකම් පිළිබඳ එසේ වාර්තා කර නොතිබුණි.

(ඇ) 2021 වර්ෂයේදී වැය විෂයයන් 3ක බැරකම් ලේඛනයේ සඳහන් වටිනාකම හා මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් හා බැරකම් ප්‍රකාශයේ සඳහන් වටිනාකම අතර රු.428,860ක වෙනසක් පැවතුණි.

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි115 (3) (අ) සහ (ආ) ජේද | පෙර වර්ෂයේ නොවැම්බර් 30ට මත්තෙන් කල යුතු ගෙවීම් වැය සම්මතයෙහි අරමුදල් නොතිබීම හෝ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සතුවූ අපරීක්ෂාකාරී බව හෝ නොසැලකිල්ල හේතු කොටගෙන ගෙවා නොමැති නම් මෙම වර්ෂයේ ගෙවීම් කිරීමට ගණන්දීමේ නිලධාරියා විසින් අනුමත කල ලිපියේ පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2021 වර්ෂයේ දී සිදුකල අදාල ගෙවීම් සම්බන්ධ ලිපි පිටපත් විගණකාධිපති වෙත ලබාදී නොතිබුණි. |
| (ආ) චක්‍රලේඛ | |
| (i) 2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 07 ඡේදය | දෙපාර්තමේන්තුව විසින් මිල දී ගන්නා සහ අපහරණය කරන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු හා යාවත්කාලීන කරන ලද ලේඛන ගත තොරතුරු අදාල කාර්තුව අවසානයේ දී කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතු වුවද 2021 වර්ෂයේ දී මිලදීගත් ගොඩනැගිලි හා ඉදිකිරීම (9151) රු.54,806,599ක් යන්ත්‍ර හා උපකරණ (9152) රු.34,938,734ක් පරිගණක මෘදුකාංග (9154) රු.121,150,375ක් හා |

පිටුව 8 | 13

| | |
|---|---|
| | යන්ත්‍ර හා උපකරණ (9152) අපහරණ රු.337,221කට අදාල තොරතුරු ද කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි. |
| (ii) 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 2021/03 හි 7.7 ඡේදය | දේපල පිරියත හා උපකරණවල අගයට සමාන වටිනාකමක් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ සංචිතයක් ලෙස දැක්විය යුතු වුවත් දේපල පිරියත හා උපකරණවල අගය හා සංචිතයේ අගය අතර රු.45,190ක වෙනසක් පැවතුණි. |

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අත්තිකාරම් ලබා දීමේ දී අදාළ කාර්යය නිසි ලෙස ඇගයීමට ලක් නොකිරීම හේතුවෙන් 2021 වර්ෂයේ දී සියයට 50ට වැඩි ප්‍රමාණයක් ආපසු මුදලින් පියවා තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) 2020 නොවැම්බර් 30 හා 2021 නොවැම්බර් 26 දිනැති පාලක ජනරාල්ගේ අභ්‍යන්තර චක්‍රලේඛවලට අනුකූල නොවන පරිදි 2020 වර්ෂයේදී ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් ආරියදාස සහ පුත්‍රයෝ වෙත ලබා දී තිබුණු රු.200,000 ක තැන්පතුවෙන් වර්ෂය අවසන් වන විට පියවා තිබුණේ රු.90,933ක් පමණි. ඉතිරි රු.109,067ක ඉන්ධන බිල්පත් 2021 වර්ෂයේදී පියවා තිබුණු අතර 2020 වර්ෂයේ අවසානයට යථෝක්ත සමාගමට ගෙවිය යුතු බැරකම් වටිනාකම ද මූල්‍ය ප්‍රකාශන අනුව රු.635,298ක් විය.

## 2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව රාජ්‍ය ආයතන විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් සඳහා විද්‍යුත් ක්‍රමවේද මඟින් රජයට ගෙවීම් ලබා ගැනීමේ දී ගනුදෙනු සැසඳීම හා පියවීම

පිටුව 9 | 13

නිසියාකාරව කල යුතු වුවද ඊට අනුකූල නොවන පරිදි 2013 වර්ෂයේදී අංක UNBIAB මගින් ලැබුණු ඇමරිකානු ඩොලර් 700ක මුදලක් වර්ෂ 8ක කාලයක් නිශ්කාෂණය නොවූ ලැබීම් ලෙස අංක 71963786 බැංකු ගිණුමේ පැවතුණි. 2020 විගණකාධිපති වාර්තාවේ ද මේ පිළිබඳ වාර්තා කලද 2021 වර්ෂයේ දී ද මෙම වටිනාකම නිරවුල් වී නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 188 (2) ප්‍රකාරව බැංකු ප්‍රකාශ ආශ්‍රයෙන් සිදු කල තැන්පත් හරියාකාරව බැරවී තිබේ දැයි වගකීම් භාර නිලධාරීන් සහතික විය යුතු අතර සැහෙන කාලයක් තුල තැන්පත් බැර වූ බවට බැංකුව විසින් දන්වා නොමැති විට එකී කාරණය සම්බන්ධයෙන් වහාම විමර්ශනය කල යුතු වුවද 2021 දෙසැම්බර් 31 දිනට නිශ්කාශනය නොවූ රු.678,464ක තැන්පත් අතර මාස 3ට වැඩි තැන්පතු රු.493,219ක පැවතුණි.

(ඉ) අංක 7041443 ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට හඳුනානොගත් ලැබීම් වටිනාකම රු.990,454ක් වූ අතර ඒ තුල මාස 3 සිට මාස 6 දක්වා වූ හඳුනා නොගත් ලැබීම් වටිනාකම රු.766,475ක් විය.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව මත්තල ගුවන්තොටුපලේ UPS පද්ධතිය සඳහා බැටරි 160ක් ප්‍රසම්පාදනය සඳහා රු.මිලියන 0.56ක් වෙන්කර තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය අනුව වියදම් වූ මුදල රු.මිලියන 2ක් ලෙස සටහන් කර තිබුණි. වැය ලෙජරය අනුව මෙම වියදම සහතික කර ගැනීමට ද විගණනයට නොහැකි වී තිබුණි.

(ආ) රත්මලාන ගුවන්තොටුපලේ ආගමන හා විගමන කාර්යාල පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වෙන්කර තිබූ මුළු ප්‍රතිපාදනය වූ රු.මිලියන1.4ක් සමාලෝචිත වර්ෂයේදී වියදම් කර තිබුණද එහි භෞතික ප්‍රගතිය සියයට 70ක් පමණක් විය.

(ඇ) 2021 වර්ෂයේ සශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රසම්පාදන කාර්යයන් 2කට වෙන්කල වටිනාකම ඉක්මවා රු.මිලියන 37.7ක වියදම් දරා තිබුණි.

පිටුව 10 | 13

(ඇ) ප්‍රසම්පාදන සැලැස්මේ අයිතමයන් 3ක් සඳහා වෙන් කර තිබූ මුදල් වලින් සියයට 35, සියයට 42 හා සියයට 76 බැගින් ඉතිරිවීම නිරීක්ෂණය වූ බැවින් වෙනත් සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රතිපාදන යෙදවීමට තිබුණු අවස්ථාවන් ඇහිරී තිබුණි.

## 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේදී රු.මිලියන 7.4කට මිලදී ගත් හා එම මිලටම පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගෙන තිබුණු අංක CAE – 9358 දරන කාර් රථය 2016 ඔක්තෝම්බර් 15 දින අනතුරකට පත් වී ඇති අතර මෙය අළුත්වැඩියා කර යථාතත්වයට පත්කිරීමේ හැකියාවක් නොමැති බවත් නැවත පාවිච්චි කිරීමට සුදුසු තත්වයේ නොපවතින බවත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ 2019 මාර්තු 08 දිනැති ලිපිය මඟින් තහවුරු වන අතර 2016 ඔක්තෝම්බර් 27 දිනැති නියෝජිත ආයතනය විසින් නිකුත් කර ඇති ලිපිය අනුව පූර්ණ හානියක් බව තවදුරටත් තහවුරු කර තිබුණි. එසේ වුවද අදාල නිර්දේශ පරිදි මෙම වාහනය සඳහා පූර්ණ හානි වන්දිය ලබා ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකිවී තිබුණි.

(ආ) යථෝක්ත අනතුරින් පසුව වසර 4කට වැඩි කාලයක් විධිමත් ක්‍රියාමාර්ගයක් නොගෙන කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තබා 2021 අප්‍රේල් මස අළුත්වැඩියා සඳහා පෞද්ගලික ආයතනයකට භාරදී තිබුණි. මෙම තත්වය වාහනයේ භෞතික වටිනාකම පිරිහීමට හේතුවී ඇති බවත් දිර්ග කාලයක් වාහනය භාවිතයෙන් තොරව කාර්යාල පරිශ්‍රයේ ගාල් කිරීම තුලින් එහි ආරක්ෂාව හා පැවැත්ම පිළිබඳ ආයතනයේ අවධානය යොමුවී නොතිබුණු බවත් විගණනයේදී වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ඇ) නියෝජිත ආයතනයේ මෙම රථය ගාල් කර තැබීම හේතුවෙන් 2017 වර්ෂයේදී රු.10,000ක් එම ආයතනයට ගෙවීම් කර තිබුණි.

පිටුව 11 | 13

(ඇ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය එනම් මෘදුකාංග හා ආශ්‍රිත දත්ත සහ ප්‍රත්‍යන්ත පාලන පද්ධතිය, වීසා සැකසීම, ගමන් බලපත්‍ර පද්ධතිය, පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පද්ධතිය යනාදී පද්ධති සඳහා පෞද්ගලික ආයතන 12ක් සමඟ එළඹ තිබූ දීර්ග කාලීනව පවතින ගිවිසුම් කාලානුරූපීව යාවත් කාලීන කිරීම සිදු කර නොතිබුණි. ගිවිසුම් කාලය අවසන් වී මාස කිහිපයකට පසුව මෙම පෞද්ගලික ආයතන විසින් සකසන ලද ගිවිසුම් හා ආයතනය සපයන සේවා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සෑහීමකට පත්වන බවට පාලක (තොරතුරු තාක්ෂණ) විසින් ලබාදෙන සහතිකය අනුව ගිවිසුම් යාවත්කාලීන කරනු ලබන අතර දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහල නැංවීමට අවශ්‍ය ඇගයීම් හා සංශෝධනයන් මෙම ගිවිසුමට ඇතුලත් නොවන බවද නිරීක්ෂණය විය. මෙසේ ප්‍රමාද වී අළුත් කරන ලද ගිවිසුම් සඳහා හිඟ මාසයන් හි සේවා ගාස්තු ද එකතු කර එකවර මුදල් ගෙවීම සිදු කර තිබුණි.

(ඉ) භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය වෙනුවෙන් ගිවිසුම්ගත කාලය අවසන් වුවද 2022 මැයි මාසය අවසානය දක්වා ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණු අවස්ථා 3ක් පැවතුණි.

4. යහපාලනය

4.1 මහජනයා වෙත සේවා ඉටුකිරීම

ප්රත්‍යන්ත පාලන පද්ධතිය, වීසා සැකසීම, ගමන් බලපත්‍ර පද්ධතිය හා පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පද්ධතිය යනාදී පද්ධතිවල මිලදී ගැනීම් හා සේවාවන් සැපයීම වෙනුවෙන් ආයතන 6 ක් සමඟ දෙපාර්තමේන්තුව විසින් ගිවිසුම් ගතවී තිබුණු අතර 2021 හා 2020 වර්ෂයන්හිදී එම ආයතන වෙත පිළිවෙලින් රු.මිලියන 145.7ක් හා රු.මිලියන 142ක් නඩත්තු හා සේවා සඳහා ගෙවීම් කලද එම පද්ධතිය වරින්වර ක්‍රියා විරහිතවීම හා පද්ධතිය අඩපණවීම සිදුවන අතර ඒ තුලින් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය කාර්යක්ෂමව සිදුකර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම වීසා කාලය ඉක්ම වීම හේතුවෙන් නිත්‍යානුකූල නොවන ලෙස රට තුල රැඳිසිටින්නන්ගේ මුළු සංඛ්‍යාව හඳුනා ගැනීමට හා විදේශ ධූත මණ්ඩල අංශයෙන් නිකුත් කරන ගමන් බලපත්‍ර වල ආදායම වෙනම හඳුනා ගැනීමට නොහැකි වීමද විගණනයට නිරීක්ෂණය විය.

පිටුව 12 | 13

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දිනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 1292ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 1016ක් වූ බැවින් පුරප්පාඩු හා අතිරික්ත කාර්යමණ්ඩලය පිළිවෙළින් 278ක් හා 02ක් විය.

(ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තනතුරක් වූ ආගමන හා විගමන පාලක (විමර්ශන හා මෙහෙයුම්) තනතුර වර්ෂ ගණනාවක සිට හිස්ව පවතින අතර 2021 වර්ෂයේදී ද බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ අනුමත සංවර්ධන නිලධාරි තනතුරු සංඛ්‍යාව 20ක් වුවද, 2021 වර්ෂය අවසානයට අතිරික්ත නිලධාරීන් දෙදෙනෙකු සේවය කරමින් සිටි අතර වාර්තාවේ දිනට එක් සංවර්ධන නිලධාරියෙකුගේ අතිරික්තයක් පැවතුණි.

එම්.සෝමතිලක

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

එම්. සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටුව 13 | 13

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**
குடிவரவு குடியகல்வுத் திணைக்களம்
**Department of Immigration & Emigration**

"සුහුරුපාය",  ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
சுஹுருபாய" ஸ்ரீ சுபுதிபுர வீதி, பத்தரமுல்லை, இலங்கை
"Suhurupaya", Sri Subhuthipura Road, Battaramulla, Sri Lanka

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව